


# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT
# 2020



**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය**
**இலங்கை போக்குவரத்துச் சபை**
**SRILANKA TRANSPORT BOARD**
**අංක : 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05**
**இல. 200,கிருல வீதி,நாராஹேன்பிட்ட,கொழும்பு 05**
**NO : 200, KIRULA ROAD, NARAHENPITA, COLOMBO 05**

# වාර්ෂික වාර්තාව

# 2020

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

# පටුන


1. දැක්ම, මෙහෙවර, අරමුණ

2. හැඳින්වීම

3. සභාපතිතුමාගේ පණිවිඩය

4. කාර්ය සාධනය සහ ප්‍රගති සමාලෝචනය

5. ගිණුම්කරණ ප්‍රතිපත්ති

6. මූල්‍ය ප්‍රකාශය

7. විගණකාධිපති වාර්තාව

**දැක්ම**

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

**මෙහෙවර**

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක්, ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

**අරමුණු හා පරමාර්ථ**

1. ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක,ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. පිටකොටුව මධ්‍යම බස් නැවතුම් පොළේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන් වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ගබඩාව පවත්වාගන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

**හැඳින්වීම**

සියලුම ආකාරයේ ප්‍රවාහන මධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනයකරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවකට පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටමවැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගීන් ප්‍රවාහය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින්පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂමණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1994වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවීය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තයන්, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, වෘත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂනයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් “2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත” මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

**සභාපතිතුමාගේ පණිවිඩය**

2020.01.01 සිට 2020.12.31 දක්වා කාල සීමාව සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටුවෙමි. මා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස 2019.12.27 වන දින වැඩ භාරගත් අතර සමාලෝචනයට භාජනය වනකාල සීමාව තුළ මා සභාපති ලෙස, 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංගම වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කරන්නෙමි.

ශ්‍රී ලංකාවේ පවතින විශාල ආයතනවලින් ශ්‍රී ලංගමයද එකකි. ජනසතු කිරීමට පෙර ප්‍රවාහන පද්ධතිය සංවිධානය කරනු ලැබුවේ පෞද්ගලික බස් හිමියන් අතළොස්සක් විසිනි. ජාතික ධනය පුද්ගලයන් කිහිප දෙනෙකුගේ අතෙහි සංකේන්ද්‍රණය වීම අසාධාරණ බැවින් ජාතික ධනය මේ රටේ ජනතාව අතර ඒකාකාරව බෙදා හැරිය යුතු බව පැහැදිලිවීම නිසා බස් සේවාව ජනසතුකරණය කරන ලදී. ඒ නිසා ශ්‍රී ලංගමෙහි ප්‍රගතිය බොහෝ දුරට රඳා පවතින්නේ ආයතනයේ සේවකයන්ගේ හා කළමනාකාරීත්වයේ ප්‍රයත්නයන් මත බව අවබෝධ කර ගැනීම සුදුසුය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් දිනකට ධාවනය කරනු ලබන සාමාන්‍ය බස්රථ සංඛ්‍යාව3961 කි.ධාවනය කළ මුළු කිලෝමීටර් ප්‍රමාණය මිලියන 25.7 ක් වන අතර,එහි පසුගිය වසරට සාපේක්ෂව 94% ක අඩු වීමක් දක්නට ලැබේ. එය මිලියන 405.6 කි.

2020 මාර්ග ලේඛන ආදායමරු. මිලියන 16,787.3 ක් වන අතර, එය 2019 දී රු. මිලියන 27,441.6 කි. ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 10,654.3ක අඩු වීමක් දක්නට ලැබේ. එය 38.82% ක අඩු වීමකි. එම ආදායම අඩුවීම සඳහා 2020 මාර්තු මස රටේ ඇති වූ කොවිඩ් වසංගතතත්ත්වය සෘජුව බලපෑම් ඇතිකර ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.මිලියන 2104.9 ක් වාර්තා වන අතර, එය 2019 වර්ෂයට සාපේක්ෂව 443%ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද අරමුදල් මඟින් එන්ජින් 893 ක් ද,ගියර් පෙට්ටි 999ක්ද,බස් බොඩි 710ක්ද අළුත්වැඩියා කරන ලදී. බස්රථවල තදබදය අඩු කිරීම සඳහා බස්රථ මෙහෙයුම් වාර ගණන වැඩි කිරීම,උදේ සහ රාත්‍රිසේවා වැඩිකිරීම ආදිය සිදු කළත්, 2020 මාර්තු මස 19 වන දින සිට කොවිඩ් 19 පැතිරයාමේ ව්‍යාකූල තත්ත්වය නිසා රට කඩින් කඩ වසා දැමීමත් සහ විටින් විට විවිධ ප්‍රදේශයන් හුදකලා කිරීමත් නිසා බස්රථ ධාවන කටයුතුත් ශ්‍රී ලංගම අනෙකුත් මෙහෙයුම් කටයුතුත් සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි වූ බව ද මතක් කරමි. නමුත්, එම අවස්ථාවේ රටේ අත්‍යාවශ්‍ය සේවාවක් වූ ශ්‍රී ලංගම බස්රථ සේවාව සෞඛ්‍ය අංශයේ හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සේවකයින් ප්‍රවාහනය කිරීම, කොවිඩ් රෝගී ආශ්‍රිතයින් ප්‍රවාහනය කිරීම, කොවිඩ් රෝගීන් ප්‍රවාහනය කිරීම, විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා විශ්‍රාමිකයින් ප්‍රවාහනය කිරීම, පොලීසිය ඇතුළු යුධ හමුදා ප්‍රවාහනය කිරීම වැනි අත්‍යාවශ්‍ය සේවාවන් ප්‍රසංශනීය අන්දමින් ලබා දීමට හැකි වීම සතුටට කරුණක් බව ප්‍රකාශ කරමි.

ප්‍රධාන වශයෙන් කොවිඩ් වසංගතය පැතිර යාම හේතුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මූල්‍ය කාර්යය සාධනය 2020 වර්ෂයේදී මන්දගාමී බවක් පෙන්නුම් කර ඇත. එම තත්ත්වය වර්තමානය වන විට සමනය වී ඇති අතර, දැනට ධාවනය සඳහා මුදාහරින ලද බස්රථ 5100 ක ප්‍රමාණයෙන් සාමාන්‍යයෙන් දිනකට ධාවනය වන්නේ බස්රථ 4,600 ක් පමණක් වන අතර,සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම රු. මිලියන 112ක් පමණ වේ. තවද, වර්තමානය වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කළමනාකරණ සේවා චක්‍ර ලේඛන අංක 02/2016 අනුව, PLI, PL II සහ PL III සේවකයින් සඳහා වැටුප් ගැලපීම් සිදුකර අවසන් බවද ප්‍රකාශ කරමි.

මණ්ඩලයේ මෙහෙවර හා දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා සමස්ත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද දායකත්වය පිළිබඳව මම ඉතා සතුටු වෙමි. රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මට සහය දුන් ගරු ප්‍රවාහන අමාත්‍යතුමා,බස් ප්‍රවාහන සේවා සහ දුම්රිය මැදිරි සහ මෝටර් රථ කර්මාන්ත ගරු රාජ්‍ය අමාත්‍යතුමා,අමාත්‍යාංශ දෙකෙහිම ලේකම්වරු,මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් යන අයට සහ විශේෂ උනන්දුවක් සහ ඕනෑකමක් දැක්වූ අනෙකුත් සියලුම අයටත් මාගේ ස්තූතිය පුද කරමි.

මේ වන විට කොවිඩ් 19 හේතුවෙන් උද්ගතව ඇති තත්ත්වයට ඔරොත්තුදීමේ හැකියාව සහ ස්ථාවරත්වය අප සතුව පවතී. ශ්‍රී ලංගම වර්ධනය සහ සමෘද්ධිය කරා ගමන් කිරීමට අප සියල්ලන්ම එකමුතුව ගමන් කිරීම වැදගත් වේ.

කිංස්ලි රණවක,
සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

❖ ධාවන කොට්ඨාශය

01. 2020 වර්ෂය තුල ධාවනයට දිනකට ලබාදුන් සාමාන්‍ය බස්රථ ප්‍රමාණය 5,272ක් වූ අතර දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස්රථ ප්‍රමාණය 3,753ක් පමණ වේ. දිනකට ධාවනය කළ සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය මිලියන 0.81ක් පමණ වේ. උපයනු ලැබූ සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම කිලෝමීටරයකට රු 56.07කි.2020වර්ෂයේ රටතුල ඇති වී තිබූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ධාවනයට එක් කරන ලද බස්රථ ප්‍රමාණය ධාවනය කරන බස්රථ ප්‍රමාණය ලද සහ ධාවනය කළ කි.මී.ප්‍රමාණයේ විශාල පසුබෑමකට ලක්ව ඇත.

02. ශ්‍රීලංගම මගින් සපයනු ලබන ප්‍රථම සහ රාත්‍රී ගමන්වාර තරකිරීමත් මගී අවශ්‍යතාවය අනුව එම සේවා වර්ධය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

03. ශ්‍රී ලංගම බස්රථ සේවා සහ දුම්රිය ඒකාබද්ධ සේවය වර්ධනය කිරීම අරමුණ කරගෙන මගී අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දුම්රිය ස්ථානවල සිට ආරම්භකරන සේවා වර්ධනය කිරීමටත් නව සේවා ආරම්භ කිරීමටත් පියවර ගෙන ඇත.

04. සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ සිසුසැරිය බස්රථ සේවාවන් 740 ක් දක්වා වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇති අතර ඉදිරියටත් සිසුන්ගේ සහ පාසල්වල අවශ්‍යතාවය සහ ඉල්ලීම් සලකා බලා මෙම සේවාව තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය විධිවිධාන සකස්කර ඇත.

05. සියළුම බස්රථ සඳහා විද්‍යුත් ටිකට්මැෂින් යොදාගැනීම තුලින් බස්රථ මගින් මගීන්ට සැපයෙන සේවා කාර්යක්ෂමතාවය ඉහල නංවා ගැනීමටත් ඵලදායීතාවය වර්ධනය කරගැනීමටත් හැකියාව ලැබී ඇත.

**සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය**

**අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන්වාර ධාවනය**

අළුයම ප්‍රථම සහ රාත්‍රී අවසන් ගමන්වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායකත්වය සෘජුවම දායක වන නමුත් මෙම සේවාව තුලින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇතිතේ කීර්තිනාමය පමණි. නමුත් ශ්‍රී ලංගම සිදු කරනු ලබන තවත් සමාජීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව මගී ජනතාවගේ සුවපහසුව පිණිස අඛණ්ඩවම ක්‍රියාත්මක කෙරේ.

**ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ධාවනය**

ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගම සහ නගර යා කිරීමේ ප්‍රබලතම ප්‍රවාහන මාධ්‍ය ලෙස සෘජුව දායකත්වයක් ලබාදෙනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයයි. මගීන්ගේ අවශ්‍යතා සලකිල්ලට ගනිමින් මෙම සේවා අඛණ්ඩව සැපයීම සඳහා සෑම විටම කටයුතු කරන අතර ඉදිරියේදීද නව බස්රථ මිලදී ගෙන මෙම සේවාව වර්ධනය කිරීමට සැලසුම් සකස්කර ඇත්තේ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීමට ග්‍රාමීය ප්‍රවාහනය විධිමත් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවිනි.

**පාසල් සේවා බස්රථ ධාවනය**

ශ්‍රී ලංගම විසින් දැයේ හෙට දිනය වෙනුවෙන් පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා විහාල සේවාවක් ඉටු කරනු ලබයි. මගී අවශ්‍යතාවය වැඩි කාලය තුළ ඉහල ලාභයක් ඉපයීමට හැකියාව ඇති අවස්ථා අහිමි කර ගනිමින් දැයේ අනාගත පරපුර නියමිත වේලාවට පාසලට රැගෙන යාම සහ ආපසු නිවෙස් බලා ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංගම සතු බස්රථ මගින් ප්‍රශස්ථ සේවාවක් සපයනු ලැබේ.

❖ **ලේකම් කොට්ඨාශය**

**2020 වර්ෂයේ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

**<u>2020 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන</u>**

| | | |
|---|---|---|
| 01 වන රැස්වීම | - | 2020.02.11 |
| 02 වන රැස්වීම | - | 2020.04.28 |
| 03 වන රැස්වීම | - | 2020.06.26 |
| 04 වන රැස්වීම | - | 2020.07.24 |
| 05 වන රැස්වීම | - | 2020.09.08 |
| 06 වන රැස්වීම | - | 2020.10.27 |
| 07 වන රැස්වීම | - | 2020.11.24 |
| 08 වන රැස්වීම | - | 2020.12.29 |

2020 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පවත්වා ඇත.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාළ කටයුතු**

01. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වෙන දිනය සඳහන් කර සියලුම අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා ශ්‍රී ලංගම කොට්ඨාශ/අංශ ප්‍රධානීන් වෙත නිවේදන නිකුත් කිරීම.

02. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා භාරගෙන පත්‍රිකා අංක යොදා ලේඛනගත කිරීමෙන් අනතුරුව ගොනු සකසා, අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත භාරදීම.

03. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා පිළිබඳව හා චක්‍ර ලිපි පිළිබඳව සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීමේ න්‍යාය පත්‍රය සැකසීම.

04. න්‍යාය පත්‍රයට අනුව හා සභාපතිතුමාගේ උපදෙස් මත අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා හා චක්‍රලිපි සභාගත කිරීම.

05. ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට හා චක්‍රලිපියට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන තීරණය හා ආනුෂංගික උපදෙස් නිවැරදිව වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අයිතම අංක අනුව සටහන් කිරීම.

06. එසේ සටහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද පසු එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් වල උධෘතයන් එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කළයුතු ශ්‍රී ලංගම කොට්ඨාශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන් වෙත භාරදීම.

07. මෙම සියලුම කටයුතු නිවැරදිව, රහස්‍යභාවයෙන් යුතුව හා විධිමත්ව ඉටු කිරීම.

08. ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ආරාධනා ලද කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් වෙත සංග්‍රහ ලබාදීම.

09. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවන ( ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට සහභාගිත්ව දීමනා ගෙවීමේ කටයුතු සිදුකිරීම.

10. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වන (ශ්‍රී ලංගම නිලධාරින් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේ කටයුතු සිදුකිරීම.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉඩකඩම් වලට අදාළ කටයුතු ඉටුකිරීම

(01) ශ්‍රී ලංගම ශාලිකා ක්‍රීඩාංගණය හා ක්‍රීඩා සංකීර්ණය පිහිටි ඇන්ඩර්සන් ගොල්ෆ් ලින්ක් නමැති හෙක්ටයාර් 3.4125 ක් වූ රජයේ ඉඩම දීමනාපත්‍රයක් මගින් ශ්‍රී ලංගමය වෙත පවරාගැනීමට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඊට අනුශාංගික අමාත්‍ය මණ්ඩල සටහන් ආදියේ මූලික ලේඛන සකසා ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කර අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගෙන ඇත.

2021 මාර්තු මස 15 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණයට අනුව 1966 පැවති නොදියුණු තක්සේරු වටිනාකම් ගෙවා ඉඩම පවරාගැනීමේ කටයුතු ඉටුකර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය/ ඉඩම් කොමසාරිස් ජෙනරාල් කාර්යාලය/ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යන ආයතන සමග සම්බන්ධීකරණය කරමින් ඉදිරි කටයුතු කරනු ලැබේ. (මෙය 2021 වර්ෂයට ද අදාළ වේ.)

(02) ශ්‍රී ලංගම වෙත නොතිබුණු පොතුහැර රියදුරු අභ්‍යාස විද්‍යාල ඉඩමට අදාළව ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ ලබාදෙන 44 වගන්තිය යටතේ වන පැවරුම් සහතිකයේ පිටපතක් ලබාගෙන හිමිකම තහවුරු කිරීමට කටයුතු කර ඇත.

(03) ශ්‍රී ලංගම උඩහමුල්ල ඩිපෝව පිහිටා තිබෙන අක්කර 04 රූඩ් 03 පර්චස් 05.02 වන ඉඩම අත්කරගැනීමේ කටයුතු මීට වසර 50 පමණ පෙර ආරම්භකර තිබුණ ද එම කටයුතු සම්පූර්ණ වී නොතිබුන බැවින් අදාළ සම්බන්ධීකරණ කටයුතු ඉටු කරමින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කර ලිපිගොනු සම්පූර්ණ කරවාගෙන ඉඩම් අත්කරගැනීමේ පනතේ පැවරුම් සහතිකය ලබාගැනීමට කටයුතු කර ඇත. (මෙය 2021 වර්ෂයට ද අදාළ වේ.)

එමෙන්ම මෙම ඉඩමේ පිහිටි අනවසර වෙළඳසැල් ඉවත් කර ගැනීම සඳහා රජයේ ඉඩම් සන්තක ආපසු ලබාගැනීමේ පනත යටතේ නඩු පැවරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ශ්‍රී ලංගම නීති අංශයට දන්වා ඇති අතර ඒ අනුව කටයුතු සිදුවෙමින් පවතී.

(04) 1996 වසරේ දී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට පවරාදීමට කටයුතු යොදා තිබූ හා නාගරික සංවර්ධන අධිකාරියට පවරාගැනීමට තිබූ හෝමාගම පැරණි බස් නැවතුම්පළ ඉඩමෙන් මාර්ග සංවර්ධනය සඳහා පවරාගත් පර්චස් 10.9 ක ඉඩම් කොටසට අදාළ හිමිකම් පරීක්ෂණයක් මගින් පිරිනම ලද වන්දි තක්සේරු මුදල ලබාගැනීමට කටයුතු කර ඇත.

ඒ අනුව වන්දි මුදල වන රු.31,154,750/- ක මුදලින් 31,045,250/- ක මුදලක් ශ්‍රී ලංගම මුදල් කොට්ඨාශය වෙත ලබාගැනීමට ක්‍රියා කර ඇත.

(05) නාගරික සංවර්ධන අධිකාරියෙන් ශ්‍රී ලංගමයට හිමිවිය යුතු මුදල් ලබාගැනීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය දැනුවත් කරමින් නාගරික සංවර්ධන අධිකාරිය සමග නිරන්තර ලිපි හුවමාරු කරගනිමින් අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත. එහෙත් නාගරික සංවර්ධන අධිකාරියේ පමාව මත අදාළ මුදල් ගෙවීම සිදුකර නැත.

(06) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් ශ්‍රී ලංගමය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සමග කොන්දේසි සහිතව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන ශ්‍රී ලංගමය හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව අතර වර්ෂ 2016/01/25 සිට 2019/01/24 දක්වා කාලයකට ගිවිසුම්ගතව එළඹ ඇත.

2016/01/25 – 2017/01/24 - රු.2,260,000/-
2017/01/25 – 2018/01/24 - රු.2,260,000/-
2018/01/25 – 2019/01/24 - රු.2,260,000/-

මුදලකට අනුව ගිවිසුම් ගතව මුදාහරින ලදී. පසුව 2019/05/22 දිනැති නාගරික කොමසාරිස්තුමියගේ ලිපිය මගින් තවත් වසරකට (2019/01/25 සිට 2020/01/24 දින දක්වා) එම භූමිය ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව 2019/06/07 වර්ෂයේ 04 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පත්‍රිකා අංක 49 යටතේ 2019/01/25 සිට 2020/01/24 දක්වා උක්ත භූමිය බදු ලබාදීමට අනුමැතිය ලබාගන්නා ලදී.

එම කාලයට අදාළ බදු ගිවිසුම සකස්කොට අත්සන් තැබීමට හා එම බදු මුදල (රු.2,260,000/-) අයකර ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ අදාළ පාර්ශ්වයන් ලිඛිතව හා වාචිකව කිහිප වතාවක්ම දැනුවත් කළ නමුත් ඒ සම්බන්ධයෙන් ගෙවීම් කටයුතු හා ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු ද මේ වනතෙක් සිදු කිරීමට නොහැකි විය.

තවද, බදු කාලය ඉක්ම වුවද මෙම භූමිය නැවත ශ්‍රී ලංගමය වෙත භාර නොදීම හා ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් බෙදුම්කරණ ක්‍රියාදාමය සඳහා ශ්‍රී ලංගම නිති කොට්ඨාශය විසින් පියවර ගනිමින් ඇත.

(07) ශ්‍රී ලංගම හා පිටකොටුව මධ්‍යම බස්රථ සංකීර්ණයෙහි පිහිටි මගී ලැඟුම්හල, ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව මාසික බදු කුලිය ගෙවීමේ පදනම මත මුදාහරින ලදි. ඒ අනුව,

2015/12/31 සිට 2020/12/21 දක්වා එම කාලය නියමිතය.

- 2015/12/21 සිට 2017/12/20 දක්වා මසකට රු.120,000/- ක මුදලක්, එම ආයතනය (හේෂාන් කේටරිස් (පුද්) සමාගම) මගින් ශ්‍රී ලංගමට ගෙවීම් කටයුතු සිදුකළ අතර, සෑම මසකම ඒ සම්බන්ධ මුදල් ගෙවීම් රිසිට්පතක් මුදල් අංශය මඟින් නිකුත් කර ඇත.

- 2017/12/21 සිට 2020/12/20 දක්වා මසකට රු.135,000/- බැගින් 2020 පෙබරවාරි මාසය සඳහා ගෙවීම් කටයුතු නිසියාකාරව සිදුකරන ලදි. ඒ සඳහාද සෑම මසකම මුදල් ගෙවීම් රිසිට්පතක් මුදල් අංශය විසින් නිකුත්කරන ලදි.

- තවද, මෙම ගිවිසුම අවසන් වීමෙන් පසු ශ්‍රී ලංගම 2020 07 වන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකා අංක 86 ඉදිරිපත් කර එම අධ්‍යක්ෂ තීරණය පරිදි උක්ත භූමිය සඳහා නව තක්සේරු විනාකමක් ලැබෙන තුරු ඉදිරි මාසයන් සඳහා පෙර බදු වටිනාකම වන රු: 135,000 මුදලක් අය කරන ලෙස අනුමැතිය ලබා දුන් අතර, ඒ අනුව සෑම මසකම මුදල් ගෙවීම් රිසිට්පතක් මුදල් අංශය විසින් නිකුත්කරන ලදි.

(08) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හක්මණ ඩිපෝව පිහිටි මුලටියන දිද්දෙනිපොතවත්ත ඉඩමෙන් කොටසක් (අක්කර 03 රූඩ් 02 පර්චස් 23.4) සඳහා රු: 109,000/- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් අංක 12491 දරණ විකුණුම්කරයක් (ඔප්පුවක්) ලබා ගැනීම.

(09) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මතුගම ඩිපෝව පිහිටි සෙන්ට් ජෝර්ජ්වත්ත ඉඩමෙන් කොටසක් (අක්කර 10 රූඩ් 00 පර්චස් 00) සඳහා රු: 109,000/- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් අංක 12559 දරණ විකුණුම්කරයක් (ඔප්පුවක්) ලබා ගැනීම.

(10) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දැරණියගල ඩිපෝව පිහිටි උඩබාගේවත්ත (පහළ කොටස) ඉඩමෙන් පිඹුරු අංක 809 කැබලි අංක 01,02 සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් විකුණුම්කරයක් (ඔප්පුවක්) ලබා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.

(11) ශ්‍රී ලංගම ඉන්ධනහල් ව්‍යාපෘතිය යටතේ මේ වන විට ඔරුගොඩවත්ත ඉන්ධනහල ඉදිකිරීමේ කටයුතු අවසන් අධියරේ පවතින අතර, ඒ සඳහා ඉදිරි පියවර ගැනීමට ප්‍රධාන විධායක නිළධාරීගේ ප්‍රධානත්වයෙන් විශේෂ සාකච්ඡාවක් කඩිනමින් පැවැත්වීමට තීරණය කර ඇත.

(12) 2020 අයවැය යෝජනා යටතේ කොග්ගල, මාවනැල්ල, ඇඹිලිපිටිය ඉන්ධනහල් ව්‍යාපෘතියේ අයදුම්පත් හා ලේඛන මේ වන විට ඛනිජතෙල් නීතිගත සංස්ථාවට භාර දී ඇති අතර, අදාල භූමියන් වල මිනින්දෝරු මැනුම් සිදුකර ඉන් අනතුරුව නිර්මාණ සැලසුම් සකස් කර ගැනීම සඳහා සුදුසු නිර්මාණ ශිල්පීන්ගේ සේවය ලබා ගැනීමට ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත.

(13) නුවරඑළිය සංචාරක නිවාස අංක 01 නැවත ඉදිකිරීම සඳහා මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, ඉඩමේ මැනුම් කටයුතු නිම කිරීමෙන් පසු ඉදිරි පියවර ගැනීමට නියමිතය.

(14) ලග්ගල පල්ලේගම සංචාරක නිවාසය සඳහා වෙන් කරන ලද භූමියට අදාල මිනින්දොරු මැනුම් කටයුතු සිදුකර ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇත.

- **ආරක්ෂක අංශය**

1. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගම ප්‍රාදේශීය කාර්යාල, ඩිපෝවන්, ප්‍රාදේශීය වැඩපල හා අනෙකුත් ආයතන වෙත ආරක්ෂාව සැපයීම.

2. ශ්‍රී ලංගම සම්බන්ධ මගී පැමිණිලි, මාධ්‍ය වාර්තා, හා වෙනත් විෂමාචාර සිදුවීම් සම්බන්ධ විමර්ෂණය.

3. ශ්‍රී ලංගම ආයතන තුල ඇති ගිනි ආරක්ෂණ පද්ධතිය පවත්වාගෙන යාම හා අධීක්ෂණය.

4. සියළුම ශ්‍රී ලංගම සේවක හැඳුනුම්පත් නිකුත් කිරීම.

5. ශ්‍රී ලංගම ආයතන තුල හදිසි පරීක්ෂණ පැවැත්වීම හා විනය පවත්වා ගැනීමට කටයුතු කිරීම.

6. හදිසි ආපදා තත්වයන් හිදී ශ්‍රී ලංගම දේපල හා සේවකයින්ගේ ජීවිත ආරක්ෂාව සඳහා කටයුතු කිරීම හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

7. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන වල ආරක්ෂාව සැපයීම හා එමඟින් ආදායම් ඉපයීම.

8. ප්‍රවාහන අමාත්‍යංශය හා ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යංශයේ කාරයාලවලට අවශ්‍ය ආරක්ෂාව සැපයීම.

- **ඉංජිනේරු කොට්ඨාශය**

**2020 වර්ෂ වල එන්ජින්, ගියර් පෙට්ටි, බස්බොඩි අළුත්වැඩියාව පිළිබඳ විස්තර**

| | **එන්ජින්** | **ගියර් පෙට්ටි** | **බස්බොඩි** |
|---|---|---|---|
| ප්‍රාදේශීය වැඩපලමඟින් | 432 | 190 | 313 |
| ඩිපෝ මඟින් | 300 | 809 | 253 |
| බාහිර ආයතන මඟින් | 161 | | 144 |
| **එකතුව** | **893** | **999** | **710** |

- **<u>අභ්‍යන්තර විගණන කොට්ඨාශය</u>**

<u>මුදල් අංශය</u>

01) සියළුම ගබඩාවන්හී වාර්ෂික සමීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීම.

02) ප්‍රධාන මුදල් පොත්, දෛනික මුදල් පොත, ගෙවීම් වවුචර්, මුදල් ලැබීම් හා ආදායම් එකතු කිරීම විගණනය.

03) ගිණුම්කරණ පැකේජය යොදාගනිමින් ගිණුම් කටයුතු පිළියෙල කිරීම.

<u>කාර්මික අංශය</u>

01) එන්ජින් කට්ටල් අළුත්වැඩියාව හා ගියර් පෙට්ටි අළුත්වැඩියාව.

02) ටයර් පරි    ජනය පරික්ෂා කිරිම .

**පාලන අංශය**

01) මානව සම්පත් තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

**සංවර්ධන හා සැළසුම් අංශය**

01) විවිධ වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම.

**ධාවන අංශය**

01) රජයේ ආයතන වලට නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා මුදල් ලබා ගැනිම.

02) වාර ප්‍රවේශ පත්‍ර ආදායම උපරිම කිරීම.

**වෙනත්**

01) 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මේ ක්‍රියාකාරීත්වය.

02) පාරිතෝෂික විගණනය.

03) සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන විශේෂ විගණන කටයුතු සිදු කිරීම.

04) විගණන සාකච්ඡා පැවැත්වීම.

05) විගණන හා කළමනාකරණ රුස්වීම් පැවැත්වීම.

06) රජයේ විගණන විමසුම් සඳහා පිළිතුර ලබාදිම අධික්ෂණය කිරීම.

** කොරෝනා වසංගතය නිසා දිවයින පුරා සංචරන සිමා කියාත්මක වු බැවින් විගණන කාර්යන් අඩාල වු බව තව දුරටත් දන්වමි.

## ❖ මානව සම්පත් කළමණාකරණ කොට්ඨාශය

මාසිකව රුපියල් 30,000/- දීමනාවක් යටතේ හුදෙක් කොන්ත්‍රාත් පදනම මත මාස 06 කාලය සඳහා රියදුරු / කොන්දොස්තර නව පත්වීම් ලබා දීම.

| පත්වීමේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| | **2020** |
| කොන්ත්‍රාත් රියදුරු | - |
| කොන්ත්‍රාත් කොන්දොස්තර | - |
| **එකතුව** | **-** |

විධායක ශ්‍රේණියේ පත්වීම් පිළිබඳව විස්තරය

| පත්වීමේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| | **2020** |
| ස්ථිර පත්වීම් | - |
| ආවරණ පත්වීම් / කාර්යය පැවරුම් | 382 |
| උසස්වීම් | - |
| ආවරණ පත්වීම් ස්ථිර කිරීම | - |
| ස්ථාන මාරුවීම් | 41 |
| කොන්ත්‍රාත් පත්වීම් | 05 |
| නව බඳවා ගැනීම් | - |
| **එකතුව** | **428** |

නැවත පත්වීම් ලබා දීම

| පත්වීමේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| | **2019** |
| නැවත පත්වීම් | 06 |
| **එකතුව** | **06** |

ප්‍රායෝගික පුහුණුව ලබාදීම

| පත්වීමේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| | **2019** |
| පරිගණක අංශයේ පුහුණු | 07 |
| ගිණුම් අංශයේ පුහුණු | 07 |
| කාර්මික අංශයේ පුහුණු | 19 |
| **එකතුව** | **33** |

විධායක නොවන ස්ථාන මාරුවීම්

| ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| | **2020** |
| ස්ථාන මාරුවීම් | 118 |
| **එකතුව** | **118** |

විනයඅංශය
විනය ලිපිගොනු විස්තරය

| පත්වීමේ ස්වභාවය | සංඛ්‍යාව 2020 |
|---|---|
| අවසන් කරන ලද විනය ලිපිගොනු | 1863 |
| අවසන් කරන ලද අභියාචනා ලිපිගොනු | 117 |
| **එකතුව** | **1980** |

❖ **ජංගම පරීක්ෂණ අංශය**

<u>**2020 වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (ප්‍රධාන කාර්යාලය)**</u>

| මාසය | කණ්ඩායම් ගණන | පරීක්ෂණ වාර ගණන | පරීක්ෂාකළ බස්රථ සංඛ්‍යාව | බරපතල විෂමාචාර (IV) | සුළු විෂමාචාර (V) | දඩ ගෙවූ මගින් ගණන | අයකරගත් දඩ මුදල (රු:) |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 5 | 97 | 1,281 | 34 | 0 | 27 | 13,918.00 |
| පෙබරවාරි | 5 | 94 | 1,129 | 56 | 1 | 31 | 13,612.00 |
| මාර්තු | 5 | 45 | 645 | 19 | 2 | 15 | 8,926.00 |
| අප්‍රේල් | ඇඳිරි නීතිය පැණවීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු සිදු නොකිරීම | | | | | | |
| මැයි | 3 | 19 | 231 | 14 | 0 | 0 | 0.00 |
| ජූනි | 4 | 80 | 966 | 28 | 0 | 3 | 940.00 |
| ජූලි | 5 | 82 | 1,066 | 22 | 1 | 5 | 1,548.00 |
| අගෝස්තු | 5 | 46 | 771 | 16 | 2 | 8 | 2,974.00 |
| සැප්තැම්බර් | 5 | 53 | 780 | 21 | 0 | 0 | 0.00 |
| ඔක්තොම්බර් | 4 | 50 | 611 | 14 | 0 | 1 | 402.00 |
| නොවැම්බර් | 3 | 27 | 284 | 6 | 0 | 0 | 0.00 |
| දෙසැම්බර් | 3 | 61 | 760 | 22 | 0 | 5 | 3,282.00 |
| එකතුව | | **654** | **8,524** | **252** | **6** | **95** | **45,602.00** |

**2020 වර්ෂය තුල ජංගම පරික්ෂණ ප්‍රගති වාර්ථාව (දිවයිනපුරා)**

| මාසය | කණ්ඩායම් ගණන | පරික්ෂණ වාර ගණන | පරික්ෂාකළ බස්රථ සංඛ්‍යාව | බරපතල විෂමාචාර (IV) | සුළු විෂමාචාර (V) | දඩ ගෙවූ මගින් ගණන | අයකරගත් දඩ මුදල (රු:) |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 15 | 232 | 3,556 | 44 | 18 | 139 | 34,204.00 |
| පෙබරවාරි | 16 | 233 | 3,343 | 82 | 24 | 77 | 36,170.00 |
| මාර්තු | 5 | 45 | 645 | 19 | 2 | 15 | 8,926.00 |
| අප්‍රේල් | ඇදිරි නීතිය පැණවීම හේතුවෙන් පරික්ෂණ කටයුතු සිදු නොකිරීම | | | | | | |
| මැයි | 3 | 23 | 231 | 14 | 0 | 0 | 0.00 |
| ජූනි | 11 | 110 | 1,371 | 29 | 16 | 16 | 6,138.00 |
| ජූලි | 22 | 307 | 5,174 | 54 | 53 | 83 | 34,668.00 |
| අගෝස්තු | 25 | 293 | 4,790 | 47 | 81 | 78 | 44,133.00 |
| සැප්තැම්බර් | 13 | 145 | 1,983 | 32 | 23 | 23 | 8,638.00 |
| ඔක්තොම්බර් | 10 | 93 | 1,063 | 15 | 4 | 5 | 2,258.00 |
| නොවැම්බර් | 11 | 87 | 908 | 11 | 4 | 4 | 2,026.00 |
| දෙසැම්බර් | 10 | 120 | 1,508 | 27 | 8 | 16 | 7,648.00 |
| එකතුව | | **1,688** | **24,572** | **374** | **233** | **456** | **184,809.00** |

❖ **සැළසුම් හා සංවර්ධනඅංශය**

| යෝජිත ක්‍රියාකාරකම | භෞතික ඉලක්කය | | | |
|---|---|---|---|---|
| | කාර්තුව | | | |
| | 1 | 2 | 3 | 4 |
| 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ක්‍රියාකාරීසැලසුමේ අන්තර්ගත හා අන්තර්ගත නොවූ තොරතුරු වලට අදාලව මාසික, කාර්තු හා අර්ධවාර්ෂික ප්‍රගති වාර්තා සකස්කර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස්කර 2020.12.31 දින වන විට අධ්‍යක්‍ෂක මන්ඩලය මඟින් අනුමතකර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2021 - 2023 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම සකස්කර 2020.12.31 දින වන විට අධ්‍යක්‍ෂක මන්ඩලය මඟින් අනුමතකර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2020 වර්ෂයේ අයවැය වාර්තාවට සමගාමීව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ප්‍රගති වාර්තාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සකස් කර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2020 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන වාර්ෂික වාර්තාව සැකසීම සඳහා තොරතුරු වාර්තාව සකස්කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ඉල්ලුම් කරනු ලබන විවිධ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලුම් කරනු ලබන විවිධ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| ප්‍රාදේශික වල මෙහෙයුම් ප්‍රගතිය ඇතුලත් වාර්තා සකස්කර ඉල්ලුම්කර ඇති පාර්ෂවයන් වෙත වසර පුරාවට ලබා දීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසික මෙහෙයුම් ප්‍රගතිය අන්තර්ගත ලාභාලාභ වාර්තාව සියළු ඩිපෝ, ප්‍රාදේශීය වැඩපලවල්, සංචාරක බංගලා, රියදුරු පාසල්, මධ්‍යම බස්රථ කාර්යාලය, SLTTS, රත්මලාන, ඔරුගොඩවත්ත ඉන්දන පිරවුම් හල හා ප්‍රධාන කාර්යාලය ඇතුලත්වන පරිදි මාසිකව ERP පද්ධතිය භාවිතා කර සැකසීම හා එහි යාවත්කාලීන කටයුතු සිදුකර පවත්වා ගෙන යාම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| මණ්ඩලයට අයත් තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| ප්‍රවාහන අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන ඉල්ලුම් කරන වාර්ථා සකස්කර ඉදිරිපත් කිරීම. | සකස්කර ඉදිරිපත් කර ඇත. | | | |
| තොරතුරු දැනගැනීමේ පනත යටතේ 2020 වර්ෂය තුල ලැබී ඇති තොරතුරු ලිපි වලට ප්‍රතිචාර ලිපි යැවීමට කටයුතු කර ඇත. | වර්ෂය පුරාවට සකස්කර ඉදිරිපත්කර ඇත. | | | |

- ❖ ටෙන්ඩර් අංශය

**<u>2020-01-01 දිනසිට ටෙන්ඩර් මණ්ඩල අංශයවිසින් මිළකැඳවන ලද</u>**

**<u>කාර්යය විස්තර පහත සඳහන්පරිදිවේ.</u>**

| අනුඅංකය | දිනය | කරන ලද කාර්යයන් | ටෙන්ඩරයවිවෘත කළදිනය |
|---|---|---|---|
| 01 | 2020-01-02 | 2020 වර්ෂයට ශ්‍රී ලංගමඅධිසුඛෝපභෝගීසංචාරකප්‍රවාහනසේවාඩිපෝවේබස්රථ රියදුරු/කොන්දොස්තරමහත්වරුන්හටනිල ඇදුම් ලබාදිම. | 2020-01-06 |
| 02 | 2020-01-08 | Procurement 01Nos. of Heavy Duty Dot Matrix Printer & 05 Nos. of Laser Jet Printer for SLTB. | 2020-01-24 |
| 03 | 2020-01-21 | Quotation For the Repairing of Canopy Celing& Fuel Shead at Rathmalana Depot. | 2020-02-05 |
| 04 | 2020-01-21 | Quotation For the Repairing of Work Shop Roof & Service Pit Area Roof at Rathmalana Depot. | 2020-02-05 |
| 05 | 2020-01-30 | Bid for the obtaining insurance coverage for SLTB buses and official vehicles for the year 2020 | 2020-02-06 |
| 06 | 2020-02-07 | Quotation For the Air Conditiners to the SLTB | 2020-02-17 |
| 07 | 2020-02-07 | 295x22.5 නවටයර්පෙරසවිකිරිමසදහා මිළගණන්කැඳවිම. | |
| 08 | 2020-03-04 | Supply & Delivery of Fuel Dispensing Pump for SLTB Depots | 2020-03-26 |
| 09 | 2020-03-10 | Quotation for the Renovations at central Bus Stand. | 2020-03-20 |
| 10 | 2020-03-10 | Quotation for the roof Repairing of central stoxes at Katubedda Depot. | 2020-03-30 |
| 11 | 2020-03-10 | Quotation for the civil Engineering works at Mathara Depot | 2020-03-30 |
| 12 | 2020-03-10 | Quotation for the Construction and Renovations at Koggala Bus Stand. | 2020-03-30 |
| 13 | 2020-05-26 | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්හිසිවිල්ඉංජිනේරු කාර්යයන් (ගල්, වැලි, ගඩොල්)මිලදී ගැනිම. | 2020-05-29 |
| 14 | 2020-05-26 | Supply of Annual Requirement of Toners & Ink Ribbons | 2020-05-29 |
| 15 | 2020-05-26 | Annual Requirement Of Stationery Items | 2020-05-29 |
| 16 | 2020-05-26 | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්පින්තාරුකිරිමසදහාඅවශ්‍ය තීන්ත මිලදී ගැනිම. | 2020-06-02 |
| 17 | 2020-05-02 | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්හිවහල අලුත්වැඩියාකිරිමසදහාඅවශ්‍ය තහඩුමිලදී ගැනිම. | 2020-06-03 |
| 18 | 2020-06-12 | Windows License for Saga ERP Server System. SLTB Finance Division | 2020-06-12 |

| | | | |
|---|---|---|---|
| 19 | 2020-06-12 | Supply & Delivery of Laptop Computer for SLTB | 2020-06-15 |
| 20 | 2020-06-15 | Supply & Delivery of Rest Room Furniture for SLTB | 2020-06-19 |
| 21 | 2020-06-16 | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්හටඅවශ්‍යදැවමිලදී ගැනිමසදහා මිළකැදවිම. | 2020-06-29 |
| 22 | 2020-06-24 | ඔරුගොඩවත්ත ඉන්ධනපිරවුම්හලෙහිප්‍රධානගොඩනැගිල්ලෙහිඇලුමිනියම්දොර/ජනෙල් සහපාටිෂන්සවිකිරිම. | 2020-06-30 |
| 23 | 2020-06-24 | Supply & Delivery of Rest Room Furniture for SLTB<br>II වර මිළගණන්කැදවිම. | 2020-06-29 |
| 24 | 2020-06-25 | Invitation of Quotation for Purchase of Stamps & Seals for SLTB | 2020-06-24 |
| 25 | 2020-06-30 | ශ්‍රී ලංගමසදහාවායුසමිකරණයන්ත්‍ර මිලදී ගැනිම | |
| 26 | 2020-07-01 | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්හිසිවිල්ඉංජිනේරුකාර්යයන්සදහාඅවශ්‍යඇලුමිනියම්දොර/ජනෙල්මිලදී ගැනිම. | 2020-07-06 |
| 27 | | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්හිසිවිල්ඉංජිනේරු කාර්යයන් සදහාකම්බිමිලදී ගැනිම. | 2020-06-17 |
| 27- I | | ශ්‍රී ලංගමඅම්පාර ටයර් කම්හලේ බහින් කුඩුවිකිණිම. | 2020-06-04 |
| 28 | 2020-07-02 | ශ්‍රී ලංගමරුහුණුප්‍රාදේශිකයේඩිපෝවන්හිසිවිල්ඉංජිනේරුකාර්යයන්සදහාඅවශ්‍යටයිල්මිලදී ගැනිම. | 2020-07-06 |
| 29 | 2020-07-02 | Invitation of Quotations for purchase of stamps & seals for SLTB (II වර) | 2020-07-02 |
| 30 | 2020-07-07 | භාණ්ඩඇණවුම්පත්(S-01) /ලැබිම්පත්(S-05) /නිකුත් කිරිමේපත්(S-06) /ධා-15 පොත්සදහා මිලගණන්කැදවිම. | 2020-07-15 |
| 31 | 2020-07-08 | Quotation For the Repairing of Canopy Celing& Fuel Shead at Rathmalana Depot. | 2020-07-13 |
| 32 | 2020-07-08 | ඔරුගොඩවත්ත ඉන්ධනපිරවුම්හලෙහිඅංගනයේ අන්තර් බද්ධ ගල් ඇතිරිම. | 2020-07-13 |
| 33 | 2020-07-08 | Quatation for the supply of Air Conditioners for SLTB | 2020-07-13 |
| 34 | 2020-07-09 | ප්‍රධාන කාර්යාලයේගොඩගැසීඇතිපැරණිපුවත්පත්විකිණිම. | 2020-07-16 |
| 35 | 2020-07-17 | අංගොඩඩිපොවේඉංජිනේරුඅංශයේවහල අලුත්වැඩියාකිරිමසදහාඅවශ්‍යසින්ක්/ඇලුමිනියම් තහඩුමිලදී ගැනිම. | 2020-08-17 |
| 36 | 2020-07-20 | ටාටාඑන්ජින්සහ ගියර් බොක්ස්අමතරකොටස්මිලදී ගැනිම(W-06) | 2020-08-21 |
| 37 | 2020-07-20 | අශෝක්ලේලන්ඩ්එන්ජින්සහ ගියර් පෙට්ටිඅමතරකොටස්මිලදී ගැනිම(W-05) | 2020-08-20 |
| 38 | 2020-07-22 | සැපයුම්කරුවන්ගේණයසහනපදනම මත අධිවේගී මාර්ගයේ ධාවනයසදහාඅධිසුඛෝපභෝගීබස්රථ 10 ක් මිලදී ගැනිම. | 2020-07-14 |

| | | | |
|---|---|---|---|
| 39 | 2020-08-13 | ශ්‍රී ලංගමඅම්බලන්තොටඩිපෝභූමියේමායිම්වැට සකස් කිරීමටඅවශ්‍යභාණ්ඩ මිළදි ගැනිමසදහා මිළගණන්කැදවිම. | 2020-09-02 |
| 40 | 2020-08-18 | ශ්‍රී ලංගමබස්රථ බොඩි අලුත්වැඩියාවසඳහාඇලුමිනියම්මල් තහඩු(Chequred Sheet) අවශ්‍යතාවයමිලදි ගැනිම. | 2020-09-02 |
| 41 | 2020-08-18 | ඔරුගොඩවත්ත ඉන්ධනපිරවුම්හලෙහිවිදුලිපද්ධතියඉදිකිරිමසම්බන්ධව. | |
| 42 | 2020-08-18 | Sri Lanka Transport Board Stationery Items for SLTB Division & Sections | 2020-08-28 |
| 43 | 2020-08-19 | ශ්‍රී ලංගමප්‍රධාන කාර්‍යාලයේ ධාවනකොට්ඨාශයේඇලුමිනියම්වෙන්කිරිමමගින් කාර්යාලය සැකසිම. | 2020-09-07 |
| 44 | 2020-08-19 | ශ්‍රී ලංගමඔරුගොඩවත්ත ඉන්ධනපිරවුම්හලේකැනපිකොටසසිවිලිමසවිකිරිම. | 2020-09-07 |
| 45 | 2020-08-19 | ශ්‍රී ලංගමම.බ.කාසදහාඅවශ්‍ය තට්ටුඇදන් 50 ක් මිලදි ගැනිම. (සුලු පරිමාණ ටෙන්ඩර් මණ්ඩල අනුමැතියමගින්) | |
| 46 | 2020-08-24 | ශ්‍රී ලංගමසදහාටාටාවැසිඅමතරකොටස්මිලදී ගැනිම(W-06) | 2020-09-08 |
| 47 | 2020-08-24 | ශ්‍රී ලංගමසදහාවිදුලිඅමතරකොටස්මිලදී ගැනිම(W-20/W-29) | 2020-09-09 |
| 48 | 2020-08-26 | බලංගොඩ, රත්මලානසහරත්නපුරයනඩිපෝවන්වලට භූගත ඉන්ධනටැංකිසැපයිමසහසවිකිරිම. | 2020-09-03 |
| 49 | 2020-08-26 | Quotation for the supply of Air Conditioners for SLTB (Second Time) | 2020-08 |

**<u>ටෙන්ඩර් මණ්ඩල අංශයවිසින්අමාත්‍යංශප්‍රසම්පාදනකමිටුව වෙත ඉදිරිපත්කරඇති ටෙන්ඩර්</u>**

| අනුඅංකය | දිනය | කරන ලද කාර්යයන් | අමාත්‍යංශය වෙත යොමුකරන ලද දිනය |
|---|---|---|---|
| 01 | | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) වෙත අවශ්‍ය ලිහිසිතෙල්සහ ග්‍රීස් මිළදි ගැනිම- 2020 | 2019-11-26 |
| 02 | | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම)බස්රථ සදහාඅවශ්‍ය ටයර් *පිරවිම සහ පෙරසවිකිරිම.* | 2020-07-27 |
| 03 | | ශ්‍රී ලංගම ඩිපෝවන් , ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රාදේශීය වැඩපොළවල් සඳහා පුද්ගලික ආරක්ෂක සේවාවන් ලබාගැනීම. | 2020-07-27 |

❖ **සම්පාදක අංශය**

| අනු අංකය | විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතියේ නම | 2020 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | නිමවුම් ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | සියලු මිලදී ගැනීම් හා විකිණීම් සිදු කිරීම. | මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම. | 3,691.50 | | කුඩා බස්රථ 500 ක් මිළදී ගැනීම. | 2020 වර්ෂයේදී බස් රථ මිලදී ගෙන නොමැත. |
| 02 | | | 18,125.00 | | ආසන 49 – 54 බස්රථ 725 ක් මිළදී ගැනීම. | 2020 වර්ෂයේදී බස් රථ මිලදී ගෙන නොමැත. |
| 03 | | | 9,250.00 | | ආසන 42 - 45 අධි සුඛෝපභෝගී බස්රථ 500 ක් මිළදී ගැනීම. | 2020 වර්ෂයේදී බස් රථ මිලදී ගෙන නොමැත. |
| 04 | | | 6,250.00 | | ආසන 30 - 35 අධි සුඛෝපභෝගී බස්රථ 500 ක් මිළදී ගැනීම. | 2020 වර්ෂයේදී බස් රථ මිලදී ගෙන නොමැත. |
| 05 | | | 6,050.00 | | පතුල පහත් බස්රථ 275 ක් මිලදී ගැනීම. | 2020 වර්ෂයේදී බස් රථ මිලදී ගෙන නොමැත. |
| 06 | | | 15,336.25 | | ඩීසල් ලීටර් 147,464,015 ක් මිලදී ගැනීම. | වෙළෙඳපොළ මිල ගණන් අනුව ඩිපෝ මට්ටමින් තම අවශ්‍යතාවයන් මිලදී ගැනීම සිදු කරයි. |
| 07 | | | 988.20 | 39.25 | බස්රථ නඩත්තුව/ අලුත්වැඩියාව සහ කට්ටල් නිෂ්පාදන සඳහා අවශ්‍ය අමතර කොස් මිලදී ගැනීමට කටයුතු කිරීම. | අනුමත මිල ගණන් අනුව, ප්‍රධාන කාර්යාලය මගින් හා ඩිපෝ මට්ටමින් අමතර කොටස් මිලදී ගැනීම සිදු කරනු ලබයි. එහෙත් ඩිපෝ මට්ටමින් ලබාගත් අමතර කොටස් සඳහා මිල වාර්තා සම්පාදක කොට්ඨාශය වෙත ලැබී නොමැත. මෙහි සඳහන් වී ඇත්තේ සම්පාදක කොට්ඨාශය මගින් ඩිපෝවන් වෙත ලබාදුන් අමතර කොටස් වල මිල ගණන් පමණි. |
| 08 | | | 29.43 | 17.31 | බස්රථ නඩත්තුව/ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය තීන්ත වැනි ද්‍රව්‍ය මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම. | ඩිපෝ අවශ්‍යතාව මත මිලදී ගැනීමට කටයුතු සිදු කරනු ලබයි. |
| 09 | | | 816.37 | 506.56 | බස්රථ ඇණි පවත්වාගෙන යාමට අවශ්‍ය නව ටයර් 24,120 ක් මිලදී ගැනීම. | 2020.12.31 දිනට නව ටයර් 15,132 ක් මිලදීගෙන ඩිපෝ සඳහා ලබාදී ඇත. |
| 10 | | | 24.30 | 10.63 | බස්රථ ඇණි පවත්වාගෙන යාමට අවශ්‍ය යු ටෝන් ටයර් 600 ක් මිලදී ගැනීම. | 2020.12.31 දින යූටෝන් ටයර් 276 ක් මිළදී ගැනීමට කටයුතු සිදුකර ඇත. |
| 11 | | | 104.88 | | බස්රථ ඇණි පවත්වාගෙන යාමට අවශ්‍ය රේඩියර් ටයර් 2400 ක් මිලදී ගැනීම. | අවශ්‍යතාවය අනුව අනුමත ආයතන වෙතින් ඩිපෝ මට්ටමින් මිළදී ගැනීමට උපදෙස් ලබා දී ඇත. |
| 12 | | | 145.32 | 69.80 | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය නව බැටරි 6000 මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 2020.12.31 දින නව බැටරි 2885 ක් මිලදී ගැනීමට කටයුතු සිදුකර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | | | 540.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය එන්ජින් 1080 අලුත්වැඩියා කර සැපයීම. | අයවැයෙන් මුදල් වෙන්කර නොමැත. |
| 14 | | | 360.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ගියර් බොක්ස් 1800 අලුත්වැඩියා කර සැපයීම. | අයවැයෙන් මුදල් වෙන්කර නොමැත. |
| 15 | | | 180.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ස්ටාටර් මෝටර් 6000 ක් අලුත්වැඩියා කර සැපයීම. | ඩිපෝ අවශ්‍යතාව මත ප්‍රාදේශික මගින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. වැය වූ මුදල ප්‍රාදේශික මට්ටමින් සම්පාදක කොට්ඨාශය වෙත එවා නොමැත. |
| 16 | සියලු මිලදී ගැනීම් හා විකිණීම් සිදු කිරීම. | මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම. | 144.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඕල්ටර්නේටර් 4800 ක් අලුත්වැඩියා කර සැපයීම. | ඩිපෝ අවශ්‍යතාව මත ප්‍රාදේශික මගින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. වැය වූ මුදල ප්‍රාදේශික මට්ටමින් සම්පාදක කොට්ඨාශය වෙත එවා නොමැත. |
| 17 | | | 96.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඉන්ධන පොම්ප 1200 ක් අලුත්වැඩියා කර සැපයීම. | ඩිපෝ අවශ්‍යතාව මත ප්‍රාදේශික මගින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. වැය වූ මුදල ප්‍රාදේශික මට්ටමින් සම්පාදක කොට්ඨාශය වෙත එවා නොමැත. |
| 18 | | | 21.00 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඉන්ධන විදින 6000 ක් අලුත්වැඩියා කර සැපයීම. | ඩිපෝ අවශ්‍යතාව මත ප්‍රාදේශික මගින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. වැය වූ මුදල ප්‍රාදේශික මට්ටමින් සම්පාදක කොට්ඨාශය වෙත එවා නොමැත. |
| 19 | | | 68.30 | | බස්රථ නඩත්තුව හා අලුත්වැඩියාව සඳහා අවශ්‍ය දුණුකොළ මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම. | ඩිපෝ අවශ්‍යතාව මත ප්‍රාදේශික මගින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. වැය වූ මුදල ප්‍රාදේශික මට්ටමින් සම්පාදක කොට්ඨාශය වෙත එවා නොමැත. |
| 20 | | | 1,489.06 | | බස්රථ ඇණිය පවත්වාගෙන යාමට අවශ්‍ය ටයර් පිරවීම සහ පෙරසවි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | අවශ්‍යතාවය අනුව අනුමත ආයතනය වෙතින් ඩිපෝ මට්ටමින් ටයර් පිරවීම සහ පෙරසවි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. |
| 21 | | | 207.83 | | අවශ්‍ය පරිදි ටිකට් රෝල් සහ ටිකට් පොත් මිළදී ගැනීම. | අවශ්‍යතාවය අනුව අනුමත ආයතනය වෙතින් ඩිපෝ මට්ටමින් මිළදීගැනීමට උපදෙස් ලබාදී ඇත. |
| 22 | | | 05.58 | 01.48 | අවශ්‍යතා පරිදි වාරප්‍රවේශපත්‍ර මුද්‍රණයකර සැපයීම. | ඩිපෝ අවශ්‍යතාව අනුව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| 23 | | | 11.92 | 10.05 | ශ්‍රී ලංගම මෙහෙයුම්/පාලන කටයුතු සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ සහ ලිපි ද්‍රව්‍ය මිළදීගෙන සැපයීම. | අවශ්‍යතාවය පරිදි ඩිපෝ සහ ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 24 | | | 258.05 | | අවශ්‍යතාවය පරිදි පරිගණක 150 ක්, ලැප්ටොප් 25 ක්, ප්‍රින්ටර් 50 ක්, UPS 150 ක්, Finger Print මැෂින් 100 ක් මිළදී ගැනීම. සෝලා ව්‍යාපෘති 132 ක්, ගමන් බලපත්‍ර මුද්‍රණ යන්ත්‍ර 01 ක්, ලැන්ඩ් ප්‍රොජෙක්ට් 01,සීසීටීවී කැමරා 132 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම. | අවශ්‍යතාවය පරිදි ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 25 | | | 550.00 | 48.00 | ශ්‍රී ලංගම ගොඩනැගිලිවල සහ අංගන අලුත්වැඩියාකර ගැනීමට කටයුතු සිදුකර ගැනීම. | ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය මගින් ශ්‍රම කොන්ත්‍රාත් (සිවිල්) අලුත්වැඩියා සිදුකර ගැනීමට කටයුතු කිරීම. |
| 26 | සියලු මිලදී ගැනීම් හා විකිණීම් සිදු කිරීම. | මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම. | 13.00 | 35.00 | ශ්‍රී ලංගම ගොඩනැගිලිවල සහ අංගනවල විදුලි නඩත්තු සහ නව ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදීගෙන සැපයීම. | අවශ්‍යතාව පරිදි නව ව්‍යාපෘති සඳහා මිලියන 35 ක මුදලක් ප්‍රධාන කාර්යාලය මගින් වැය කොට විදුලි නඩත්තු සිදුකර ඇත. |

❖ **පුහුණු පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය**

| පුහුණු වැඩමුළුව | පැවැත් වූ ස්ථානය | පැවැත් වූ දිනය | දිනය (දින ගණන) | සහභාගි වූ සංඛ්‍යාව | මුළු වියදම |
|---|---|---|---|---|---|
| ඉන්ධන ගබඩා පුහුණුව | ප්‍රධාන කාර්යාලය | 2020.02.07 | දින 01 | 94 | 40.343.00 |
| ප්‍රසම්පාදන කළමණාකාර පුහුණු වැඩමුළුව | ප්‍රධාන කාර්යාලය | 2020.02.18 | දින 05 | 35 | 248,890.00 |
| | | 2020.02.19 | | | |
| | | 2020.02.25 | | | |
| | | 2020.02.26 | | | |
| | | 2020.02.27 | | | |
| කළමනාකරණය සඳහා අභිප්‍රේරණ පුහුණු වැඩසටහන | කළුතර රියදුරු පුහුණු අභ්‍යාස විද්‍යාලය | 2020.02.29 /2020.03.01 | දින 02 (අදියර - 01) | 90 | 211,735.00 |
| | | 2020.03.07/08 | දින 02 (අදියර - 02) | 90 | 234,340.00 |
| අන්තර් පළාත් පොදු මගී ප්‍රවාහනයේ යෙදෙන රියදුරු මහතුන් පුහුණු කිරීම | පොතුහැර රියදුරු පුහුණු අභ්‍යාස විද්‍යාලය | 2020.03.05/06 | දින 01 | 100 | 82,280.00 |
| මගී ප්‍රවාහන සේවා රියදුරු බලපත්‍ර පුහුණු වැඩමුළුව | කළුතර රියදුරු පුහුණු අභ්‍යාස විද්‍යාලය | 2020.06.25/26 | දින 02 | 112 | 89,945.00 |
| | පොතුහැර රියදුරු පුහුණු අභ්‍යාස විද්‍යාලය | 2020.06.29/30 | දින 02 | 81 | 81,274.50 |
| ඉන්ධන පරිභෝජනය අවම කිරීම | අත්තනගල්ල යොවුන් සේනාංකය | 2020.08.19 | දින 01 | 70 | 43,218.00 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුව | අත්තනගල්ල යොවුන් සේනාංකය | | | | |
| ප්‍රසම්පාදන පුහුණු වැඩමුළුව | ප්‍රධාන කාර්යාලය | 2020.08.27 | දින 05 | 35 | 260,823.00 |
| | | 2020.09.03 | | | |
| | | 2020.09.10 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2020.09.17<br>2020.09.24 | | | |
| ගණකාධිකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ශාලිකා ශාලාව | 1. 2020.09.24 | | 120 | 54,270.00 |
| | ප්‍රධාන කාර්යාලය | 2. 2020.09.19 | | 109 | 41,246.00 |
| | ප්‍රධාන කාර්යාලය | 3. 2020.09.26 | | 109 | 43,006.00 |
| | ප්‍රධාන කාර්යාලය | 4. 2020.10.03 | | 109 | 40,486.00 |
| | පැවැත්වීමට ඇත | 5. | | | |
| කම්කරු නීති හා කාර්මික ආරවුල් පිළිබඳ පුහුණු වැඩමුළුව | ප්‍රධාන කාර්යාලය | 2020.09.16 | දින 01 | 107 | 48,413.00 |
| | කළුතර රියදුරු අභ්‍යාස විද්‍යාලය | 2020.09.16/17 | දින 02 | 52 | 61,637.00 |
| ලාභ ආලාභ ගිණුම් හා මුදල් ප්‍රවාහ සටහන් | ප්‍රධාන කාර්යාලය | 2020.09.22 | දින 01 | 104 | 48,534.00 |
| අතිගරු ජනාධිපතිතුමාගේ 55 රැකියා 100,000 වැඩසටහන අතිගරු ජනාධිපතිතුමාගේ රැකියා 100,000 වැඩසටහන | අතිගරු ජනාධිපතිතුමාගේ “සෞභාග්‍යය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම” අරමුණු කොටගෙන ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වෙත යොමු කරන ලද රියදුරු වෘත්තීය සම්බන්ධයෙන් ආධුනිකයන් 1749 කු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් NVQ 3 මට්ටමින් අදාළ පුහුණු කිරීම් සඳහා ජාතික නිපුණතා පාදක විෂය නිර්දේශයට අයත් පාඨමාලාවන් මේ වන විට දිස්ත්‍රික්ක මට්ටමින් ශ්‍රී ලංගම සම්පත් දායකත්වයෙන් සිදු කරගෙන යනු ලබයි. | 2020 දෙසැම්බර් මස සිට ආරම්භය | මාස 06 | 1749 | |

❖ <u>**නීති කොට්ඨාශය**</u>

ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය කාර්යාල හා සියලුම ඩිපෝ වලට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරනු ලබන හා ශ්‍රී ලංගම විසින් අනෙකුත් පාර්ශවයන්ට එරෙහිව පවරනු ලබන සියලුම නඩු සඳහා දිවයින පුරා පිහිටි සියලුම අධිකරණවල පවතින නඩු සම්බන්ධව කටයුතු මෙහෙයවීම.

මේ යටතේ,

i. ශ්‍රී ලංගම නඩු සඳහා නීති නිලධාරීන් හැකි සෑම අවස්ථාවකදීම එම අධිකරණවල පෙනී සිටීම.

ii. නඩුවලට අදාල අධිකරණමය ලේඛන සැකසීම.

iii. ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාලවල සිටින උසාවි නිලධාරීන් සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.

iv. එම නිලධාරීන් සමග බාහිර නීතිඥ මහතුන් හා නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ මහතුන් සම්බන්ධීකරණය කිරීම.

v. නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ මහතුන් හා සම්බන්ධ වෙමින් නීති සාකච්ඡාවලට සහභාගී වෙමින් නඩු කටයුතු මෙහෙයවීම.

1. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය කාර්යාල,

ඩිපෝ හා ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශවල පවතින නෛතික ගැටළු හා පරිපාලනමය ගැටළු වලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම.

2. ශ්‍රී ලංගම බාහිර පාර්ශවයන් සමඟ එළඹෙන බදු ගිවිසුම්, සැපයුම් ගිවිසුම්, ආරක්ෂක ගිවිසුම්, පොදු ගිවිසුම් ආදී ගිවිසුම් සකස් කිරීම.

3. ශ්‍රී ලංගම සතු ඉඩම් සම්බන්ධ ගැටළු වලදී ලේකම් කොට්ඨාශයට අවශ්‍ය උපදෙස් ලබාදීම, බාහර ආයතන සමඟ පැවැත්වෙන සාකච්ඡාවලට සහභාගිවීම සහ වාර්තා සැකසීම. ශ්‍රී ලංගමට අයත් ඉඩම්වල අයිතිය තහවුරුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකර දීම.

4. සභාපතිතුමා විසින් යොමුකරනු ලබන ගැටලු සඳහා අවශ්‍ය අවස්ථාවලදී කැබිනට් සංදේශ සැකසීම.

5. නඩුවල ගත යුතු ඉදිරි පියවර සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා යොමු කිරීම.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය තුළ වරින් වර ඇඳිරි නීතිය පැනවීම මත අධිකරණවල කටයුතු නවතා තිබූ බැවින්, නඩුවල කටයුතු දිගින් දිගටම කල් තැබුණි.

කෙසේ වුවද, නීති කොට්ඨාශය තුළ ශ්‍රී ලංගම නීති උපදේශක, ප්‍රධාන නීති නිලධාරී, සහකාර නීති නිලධාරීන් විසින් කාර්යයන් ඉටුකරනු ලබන අතර, 2020 වර්ෂයේ මෙම නිලධාරී මහතුන් විසින් ඉටුකරනු ලැබූ ඉහත කී සියලු කාර්යයන් පිළබඳව වාර්තාවක් සැකසීම ඉතා සංකීර්ණ වන අතර, එසේ වුවද, 2020 වර්ෂය තුළ නීති කොට්ඨාශය විසින් විශේෂතව සිදුකරනු ලැබූ කාර්යයන් පහත පරිදි වේ.

1. 2020 වර්ෂය තුළ මහේස්ත්‍රාත් අධිකරණ සඳහා සිතාසි 87 ක් ද, දිසා අධිකරණ සිතාසි 55 ක්, කම්කරු විනිශ්චය සභා ඉල්ලුම්පත්‍ර 16 ක් හා බේරුම්කරණ නඩු 04 ක් ද, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 02 ක් ද, අභියාචනාධිකරණ නඩු 02 ක් වශයෙන් ද මුළු සිතාසි 174 ක් ලැබී ඇති අතර, එකී නඩුවල ඉදිරි කටයුතු සිදු කිරීම.

2. 2020 වර්ෂය තුළ නීති කොට්ඨාශය මගින් සකසනු ලැබූ ගිවිසුම් සංඛ්‍යාව 07 ක් වේ.

3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත සංශෝධිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස්කර ප්‍රවාහන සේවා කළමනාකාර අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

4. ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමේදී ශ්‍රී ලංගම විසින් එකී සංශෝධන කෙටුම්පත එක් කළ යුතු සංශෝධන යොමු කිරීම.

5. අධිකරණ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංගම සියළුම ඩිපෝවල උසාවි සහයක නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

6. ශ්‍රී ලංගම දැනට පවතින විනය ව්‍යවස්ථා මාලාව සංශෝධනය කිරීම සඳහා නීති කොට්ඨාශයේ නිරීක්ෂණ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) වෙත යොමු කිරීම.

7. ශ්‍රී ලංගම සේවය කරන අනියම්/ කොන්ත්‍රාත් සේවකයින් විසින් සිදුකරනු ලබන බරපතල/බරපතල නොවන විෂමාචාර සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු බවට මානව සම්පත් කළමනාකාර කොට්ඨාශ චක්‍රලේඛය නිකුත් කිරීම අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

❖ <u>සිවිල් අංශය</u>

| | ප්‍රාදේශිකය | ඩිපෝව | කාර්යයන් විස්තරය | මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | මෙට්‍රෝ | අවිස්සාවේල්ල | සේවා අංශයේ හානි වූ වහල අළුත්වැඩියාව | 1,848,015.40 |
| | | | ඉංජිනේරු අංශයේ හානි වූ වහල අළුත්වැඩියාව | 479,991.60 |
| | | | වැසිකිළි පද්ධතිය ඉදි කිරීම | 1,136,232.00 |
| | | උඩහමුල්ල | වැට හා ගේට්ටුව ඉදි කිරීම | 656,700.00 |
| 2 | සබරගමුව | මාවනැල්ල | ඉංජිනේරු අංශයේ වැසිකිළි අළුත්වැඩියාව | 652,850.00 |
| | | දැරණියගල | යෝජිත වැසිකිළි ඉදි කිරීම. | 1,215,876.00 |
| | | රඹුක්කන | යෝජිත වැසිකිළි ඉදි කිරීම. | 1,321,284.00 |
| 3 | ගම්පහ | කිරිදිවැල | ඉංජිනේරු අංශයේ වැසිකිළි අළුත්වැඩියාව | 452,046.50 |
| | | නිට්ටඹුව | හානි වූ සේවක විවේකාගාර I අළුත්වැඩියාව | 50,705.00 |
| | | | හානි වූ සේවක විවේකාගාර අසල වැසිකිළි අළුත්වැඩියාව | 211,794.00 |
| | | ජා-ඇල | ඉංජිනේරු අංශයේ වහල හා වැහි පීලි අළුත්වැඩියාව | 1,238,380.00 |
| | | | මෙහෙයුම් අංශයේ වැසිකිළි අළුත්වැඩියාව | 121,730.00 |
| | | | ප්‍රධාන කාර්යාලයේ වැසිකිළි අළුත්වැඩියාව | 119,680.00 |
| | | | ධාවන අංශයේ කාර්යාල සේවකයින්ගේ වැසිකිළි අළුත්වැඩියාව | 266,005.00 |
| | | දිවුලපිටිය | අපත නල මාර්ගය අළුත්වැඩියා කිරීම. | 112,684.00 |
| | | | යෝජිත නව වැසිකිළි පද්ධතිය ඉදි කිරීම. | 334,587.00 |
| | | | රියදුරු කොන්දොස්තර වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 312,147.00 |
| | | | ඉංජිනේරු අංශයේ වැසිකිළි අළුත්වැඩියාව. | 106,772.00 |
| 4 | රජරට | කැකිරාව | වැසිකිළි ඉදි කිරීම | 804,783.70 |
| | | ගලෙන් බිඳුණු වැව | වැසිකිළි ඉදි කිරීම | 799,623.80 |
| | | | සේවක විවේකාගාරය අළුත්වැඩියාව | 1,444,834.00 |
| | | | සේවා රැම්ප් ඉදිකිරීම | 803,692.00 |
| | | දඹුල්ල | වැසිකිළි ඉදිකිරීම් | 775,564.50 |
| | | මැදවච්චිය | වැසිකිළි ඉදිකිරීම් | 825,490.80 |
| | | අනුරාධපුරය | ඉංජිනේරු වහල අළුත්වැඩියාව | 816,188.00 |
| | | කැබිතිගොල්ලෑව | වැසිකිළි ඉදිකිරීම් | 2,252,873.50 |
| | | | වැසිකිළි ඉදිකිරීම් | 552,940.00 |
| | | | පූතික ටැංකිය හා ගලිවල ඉදිකිරීම | 814,783.00 |
| | | හොරොව්පතාන | වැසිකිළි ඉදිකිරීම් | 793,215.00 |
| | | කන්තලේ | වැසිකිළි ඉදිකිරීම් | 209,187.80 |
| 5 | වයඹ | හලාවත | වැසිකිළි අළුත්වැඩියාව | 324,670.60 |
| | | ප්‍රධාන කාර්යාලය | වැසිකිළි අළුත්වැඩියාව | 410,278.00 |
| | | ප්‍රාදේශීය වැඩපල | වැසිකිළි අළුත්වැඩියාව | 159,813.10 |
| | | කුරු/ දකුණ | ගිණුම් අංශයේ වැසිකිළි අළුත්වැඩියාව | 148,040.82 |
| | | වෙන්නප්පුව | සේවක විවේකාගාරය අළුත්වැඩියාව | 232,795.04 |
| | | ගල්ගමුව | සේවක විවේකාගාරය අළුත්වැඩියාව | 857,943.00 |
| | | නාරම්මල | වැසිකිළි ඉදිකිරීම් | 1,517,855.00 |
| | | කුලියාපිටිය | වැසිකිළි ඉදිකිරීම් | 1,605,285.25 |
| | | රිදීගම | වැසිකිළි ඉදිකිරීම් | 1,166170.42 |

| | | | | |
|---|---|---|---|---|
| | | ගිරිඋල්ල | වැසිකිළි ඉදිකිරීම් | 1,056,246.00 |
| 6 | ඌව | මහියංගනය | ඉංජිනේරු වැසිකිලි අළුත්වැඩියාව | 304,917.40 |
| | | | රියදුරු කොන්දොස්තර වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 710,165.85 |
| | | | සේවා වලවල් අළුත්වැඩියා කිරීම | 262,850.10 |
| | | බදුල්ල | කාර්යය මණ්ඩල වැසිකිලි අළුත්වැඩියාව | 607,952.00 |
| | | | ධාවන කොට්ඨාශයේ වැසිකිලි අළුත්වැඩියාව | 276,485.00 |
| | | | රියදුරු කොන්දොස්තර වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 710,165.85 |
| | | | නිල වාහන ඒකකයේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම. | 648,415.50 |
| | | වැල්ලවාය | සේවා වලවල් ඉදිකිරීම | 2,151,000.36 |
| | | | වැසිකිලි පද්ධතිය ඉදිකිරීම | 1,644,555.00 |
| | | බස් සමවාය | මායිම් බැමි ඉදිකිරීම | 1,613,678.83 |
| 7 | රුහුණ | කතරගම | ඉංජිනේරු වහල අළුත්වැඩියාව | 988,334.34 |
| | | | රියදුරු කොන්දොස්තර විවේකාගාර අළුත්වැඩියා කිරීම | 1,099,971.37 |
| | | | වැඩමඩු ගොඩනැගිල්ලේ වහල අළුත්වැඩියා කිරීම | 447,111.00 |
| | | | කාන්තා වැසිකිලි අළුත්වැඩියාව | 475,965.00 |
| | | අකුරැස්ස | රියදුරු කොන්දොස්තර විවේකාගාරය අළුත්වැඩියා කිරීම | 741,608.00 |
| | | | ආපනශාලා අළුත්වැඩියාව | 733,402.00 |
| | | උඩුගම | වැඩ මඩුවේ වහල අළුත්වැඩියා කිරීම | 2,150,000.00 |
| | | ගාල්ල | ගබඩාවේ වහල අළුත්වැඩියා කිරීම | 735,600.00 |
| | | | ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩියාවන් | 962,933.00 |
| | | කතරගම වි/ගා | පසුපස මායිම් බැම්ම අළුත්වැඩියාව | 610,074.00 |
| | | | ඉදිරි පස මායිම් බැම්ම ඉදිකිරීම | 2,261,924.00 |
| | | අම්බලන්තොට | වැසිකිලි පද්ධතිය ඉදිකිරීම | 3,046,010.00 |
| 8 | නුවරඑළිය | ගම්පොල | වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව | 796,438.00 |
| 9 | කළුතර | හොරණ | වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව | 532,992.51 |
| 10 | නැගෙනහිර | කාත්තන්කුඩි | නව වැසිකිලි පද්ධතික් ඉදිකිරීම | 623,108.80 |
| | | | සේවක විවේකාගාරය ඉදිකිරීම | 1,671,586.54 |
| | | කලවන්චිකුඩි | වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව | 685,334.95 |
| | | ත්‍රිකුණාමලය | සේවක විවේකාගාරය වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව | 1,903,484.64 |

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1. සංස්ථාගත තොරතුරු**

**1.1 වාර්තාකරණ ආයතනය**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වූ කලී 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත යටතේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලය කොළඹ 05, කිරුල පාරේ අංක 200 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය එම ස්ථානයේම පිහිටා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) වූ කලී ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවත්නා ආයතනයකි.

**1.2 ප්‍රධාන කාර්යයන්**

වර්ෂය තුළදී මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වූයේ ජනතාවට මාර්ග මගී ප්‍රවාහන සේවා ලබාදීමය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අරමුණ වනුයේ, "ජනතාවට සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ ආරක්ෂිත විශ්වාස කටයුතු සහ සුවපහසු මාර්ග ප්‍රවාහන සේවාවක් ලබාදීමයි."

**2. සකස් කිරීමේ පදනම**

**2.1 පිළිපැදීම පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය. 2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය ඇතුළුව ඒ දක්වා වූ සියළුම කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලං.ග.ම. විසින් ස්වකීය මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබුවේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලවය. 2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලං.ග.ම. විසින් සකස් කරනු ලැබ ඇත්තේ නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය.

මූල්‍ය ප්‍රකාශ සමන්විත වන්නේ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම්පූර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, සාමාන්‍ය කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් වලිනි.

**2.2 මැනීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය.

**2.3 සංසන්දනාත්මක තොරතුරු**

පවත්නා කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය ඉහල නැංවීම සඳහා සහ අන්තර් කාල පරිච්ඡේද සංසන්දනාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති සියලුම වටිනාකම් පිළිබඳව කලින් කාල පරිච්ඡේදයට අදාල ප්‍රමාණාත්මක, කථන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු එළිදරව් කරනු ලැබේ.

වෙනත් ආකාරයට දක්වා තිබේ නම් මිස පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේදවලට නොවෙනස්වම අදාල කරගනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශවල සඳහන් අයිතමයන්ට අදාල ඉදිරිපත් කිරීම් හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවලදී, වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් ලබාදීම පිණිස, පවත්නා වර්ෂයට අනුකූල වන පරිදි සංසන්දනාත්මක මූල්‍යමය වටිනාකම නැවත වර්ගීකරණය කරනු ලැබ ඇත.

## 2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල කරගැනීම සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කිරීම අවශ්‍ය වන්නේය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ, අතීත අත්දැකීම් සහ අවස්ථාගත කරුණු යටතේ සාධාරණයයි විශ්වාස කරනු ලබන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මතය. එමනිසා සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල, මෙම විනිශ්චයන්ට සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිශෝධනය බලපාන්නේ ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට පමණක් නම් එම කාල පරිච්ඡේදයේදීද ප්‍රතිශෝධනය පවත්නා සහ අනාගත යන කාල පරිච්ඡේද දෙකටම බලපාන්නේ නම්, ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදය සහ අනාගත කාල පරිච්ඡේදයේදීද ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ ප්‍රතිශෝධන පිළිගනු ලැබේ.

## 2.5 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වනුයේ මුදල්, බැංකු ශේෂ සහ මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක් යන දෙකෙන් කෙටි කාලය තුළ මුදල් වශයෙන් උපලබ්ධි කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය. ජංගම වත්කම් හැර සෙසු වත්කම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක කාලපරිච්ඡේදයෙන් ඔබ්බට තබා ගැනීමට මණ්ඩලය අපේක්ෂා කරන වත්කම්වේ.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

## 3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකාරක අලාභ තිබේ නම් ඒවා කපා හැරීමෙන් පසු පිරිවැය වශයෙනි.

### (අ) අයිති වත්කම්

දේපල, පිරියත හා උපකරණ අයිතමයක පිරිවැය සමන්විත වන්නේ, එය මිලට ගත් මිලෙන් සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරක තත්ත්වයට ගෙන ඒමට ඍජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එයින් ද වේ. තනිව ගොඩනැඟුණු වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල සහ ඍජු ශ්‍රමයේ පිරිවැයද අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට ඍජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එම පිරිවැය ද ඇතුළත්වේ. අයිතම ගලවා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටුවන ස්ථානයේ නැවත ගබඩා කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලබන වත්කම් පිළිබඳ ණය ගැණුම් පිරිවැයද මෙයට ඇතුළත්වේ.

වත්කමක වැදගත් අංශ වෙන් වෙන්ව හඳුනාගනු ලබන අතර, එය වෙන් වෙන්ව ක්ෂය කරනු ලැබේ.

### (ආ) තදනන්තර පිරිවැය

දේපල, පිරියත හා උපකරණ අයිතමයක යම් කොටසක් සම්බන්ධයෙන් වන විට එම කොටසේ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි වන්නේ නම්, එම කොටස ප්‍රසම්පාදනය කිරීමේ පිරිවැය එම අයිතමයේ ධාරක අගය පිළිගනු ලැබේ. ප්‍රසම්පාදනය කරන ලද කොටසේ ධාරක අගය පිළිගැනීමෙන් බැහැර කෙරේ.

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා අළුත්වැඩියා කිරීමේ පිරිවැය එය දරණ අවස්ථාවේදී ලාභාලාභ ගිණුමෙහි පිළිගනු ලැබේ.

**(ඇ) ක්ෂය කිරීම**

ක්ෂය ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය සඳහා ආදේශනය කළ වෙනත් මුදල් ගණනයෙන් එහි ශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන ක්ෂය කළ හැකි මුදල මත වේ. දේපල,පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටස ප්‍රයෝජනයට ගත හැකි ඇස්තමේන්තු කළ ජීවිත කාල පදනම අනුව සරල රේඛා පදනම මත ලාභ අලාභ ගිණුමේ ක්ෂය කිරීම් පිළිගනු ලබන අතර, ඊට හේතුව වත්කමේ අන්තර්ගත ආර්ථිකප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව එහි ඉතා සමීපව පිළිබිඹුවීමය. කල්බදු කාල පරිච්ඡේදය අවසාන වන විට සමාගම හිමිකාරීත්වය ලබාගැනීම සාධාරණව නිසැක වන්නේ නම් මිස කල්බදු කාල පරිච්ඡේදය සහ කල්බදු දෙන ලද වත්කම් ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල පරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාල පරිච්ඡේදය සඳහා කල්බදු දෙන ලද වත්කම් ක්ෂය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

**ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීව කාල පහත දැක්වේ.**

| වත්කම් ගණය | ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු) | ක්ෂය කරනු ලබන ප්‍රමාණය (%) |
|---|---|---|
| ගොඩනැඟිලි | 40 | 2.5% |
| බස්රථ සහ වෙනත් වාහන | 8 | 12.5% |
| පිරියත සහ උපකරණ | 10 | 10% |
| ගෘහ භාණ්ඩ සහ සවිකුරු | 10 | 10% |
| පරිගණක | 4 | 25% |
| බස් එන්ජින් | 5 | 20% |

වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකිව තිබෙන අවස්ථාවේදී වන අතර, වත්කම් ක්ෂය කිරීම අවසාන වන්නේ වත්කම්, වත්කම විකිණීමට තිබෙන ලෙස වර්ගීකරණයකරනු ලබන දිනය සහ වත්කම පිළිගැනීමෙන් ඉවත් කරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේ දීය.

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල වටිනාකම් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම් නැවත ගලපනු ලැබේ.

**(ඈ) පිළිගැනීම ඉවත් කිරීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් අපහරණය කරනු ලැබූ විට හෝ එය ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ අපහරණය කිරීමෙන් අනාගතආර්ථිකප්‍රතිලාභ අපේක්ෂා කරනු නොලබන විට එම අයිතමයේ ධාරක මුදල පිළිගැනීම ඉවත් කරනු ලැබේ. එම පිළිගැනීම ඉවත් කිරීමෙන් හටගන්නා වාසි හෝ පාඩු ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් තුළ පිළිගනු ලැබේ.

## 3.2 කල්බදු දෙනු ලැබූ වත්කම්

හිමිකාරීත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් මණ්ඩලය භාරගන්නා කල්බදු, මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණයකරනු ලැබේ. ආරම්භක පිළිගැනීම සිදු කරනු ලැබූ විට, කල්බදු දෙන ලද වත්කමේ සාධාරණ වටිනාකම සහ අවම කල්බදුගෙවීම්වල වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට සමාන මුදලකට වත්කම් මැන ප්‍රාග්ධනගත කරනු ලැබේ. ආරම්භක පිළිගැනීමට අනතුරුව, එම වත්කමට අදාල වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වත්කම් ගිණුම්ගත කරනු ලැබේ.

සෙසු කල්බදු වනුයේ ක්‍රියාත්මක වන කල්බදු වන අතර, ආයෝජන දේපල සම්බන්ධයෙන් හැරුනු විට කල්බදු දෙනු ලබන වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ මණ්ඩලයේ ප්‍රකාශයේ පිළිගනු නොලැබේ.

## 3.3 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු බදු ආදායමක් උපයා ගැනීමට හෝ ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමට හෝ ඒ දෙකම සඳහා බලපානු ලබන, එනමුත් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය භාවිතා කරමින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීම හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ගනු නොලබන දේපල වන්නේය. ආයෝජන දේපල මනිනු ලබන්නේ පිරිවැයට අනුවය.

දේපල භාවිතය ආයෝජන දේපලවල සිට හිමිකරු පදිංචි දේපලවලට මාරු වූ විට, එම දේපල, පිරියත සහ උපකරණ වශයෙන් වර්ගීකරණයකරනු ලැබේ.

## 3.4 කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනයේදී ප්‍රාග්ධනගත කරනු නොලැබූ, වර්ෂය තුළදී දරණ ලද ප්‍රාග්ධන වියදම්, කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ ප්‍රාග්ධනගත කරනු ලැබ ඇති සහ භාවිතයට යොදා ගෙන ඇති වත්කම් දේපල, පිරියත සහ උපකරණ විෂයට මාරු කරනු ලැබ ඇත.

## 3.5 අස්පෘශ්‍යනීය වත්කම්

වත්කම්වලට ආරෝපණය කළ හැකි ආර්ථිකප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ වත්කම්වල පිරිවැය අස්පෘශ්‍ය වත්කම්- 38 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කොට ඉදිරියට ගෙන යනු ලබන්නේ නම් යම් වත්කමක් අස්පෘශ්‍යනීය වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

නියත ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර, අස්පෘශ්‍යනීය වත්කම් හානියට පත්විය හැකි බවට ඇඟවීමක් තිබෙන ඕනෑම අවස්ථාවකදී හානියට පත්වීම පිළිබඳ තක්සේරුවක් කරනු ලැබේ. නියත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් තිබෙන අස්පෘශ්‍යනීය වත්කමකට අදාල ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂ ක්‍රමය යටත් පිරිසෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ.

නිශ්චිත නොවන ප්‍රයෝජනවත් ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් තනි තනිව හෝ මුදල් ජනනය වන ඒකක මට්ටමේදී හානියට පත්වීම සම්බන්ධයෙන් වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

## 3.6 මූල්‍ය නොවන වත්කම් හානියට පත්වීම

හානියට පත්වන බවට යම් හැඟීමක් තිබේද යන බව නිශ්චය කිරීම සඳහා වත්කම්වල ධාරක ප්‍රමාණය, වාර්තා කරන එක් එක් දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. එබඳු යම් හැඟවීමක් තිබේ නම් එවිට වත්කම වෙනුවෙන් අය කරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරක මුදල හෝ මුදල් ජනනය වන ඒකකය එහි අයකර ගත හැකි මුදලට වැඩි වන්නේ නම් හානියට පත්වීමේ අලාභයක් පිළිගනු ලැබේ. අයකර ගත හැකි මුදල නිශ්චය කිරීම සඳහා භාවිතා කරනු ලබන ඇස්තමේන්තුවල වෙනසක් තිබුණේ වී නම් හානියට පත්වීමේ අලාභය ප්‍රතිශෝධනය කරනු ලැබේ.

## 3.7 වට්ටෝරු බඩු

වට්ටෝරු බඩු මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකෙන් අඩු මුදලට අනුවය.වට්ටෝරු බඩුවල පිරිවැය සමන්විත වන්නේ මිලට ගැනීම්වල සියලුම පිරිවැය

පරිවර්තනය කිරීමට සහ බඩු වට්ටෝරු අයිතමයන් දැනට බඩු පවත්නා ස්ථානවලට සහ තත්ත්වයට ගෙන ඒමට දැරීමට සිදුවන වෙනත් පිරිවැය වලිනි.

උපලබ්ධි කරගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතරතුරේදී තක්සේරු කරන ලද විකුණුම් මිලෙන් ඇස්තමේන්තු කළ සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවල පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකමයි.

වට්ටෝරු බඩුවල පිරිවැය නියම කරනු ලබන්නේ ඒවා එකිනෙකෙහි පිරිවැය නිශ්චිතව හඳුනාගැනීම සහ පළමුව ඇතුළු කළ දෙය පළමුව බැහැර කිරීමේ සූත්‍ර භාවිතා කිරීම මඟිනි.

## 3.8 මූල්‍ය වත්කම්

### 3.8.1 ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම

39 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල විෂය පථය තුළ මූල්‍ය වත්කම් අදාල පරිදි ලාභ හෝ අලාභ මඟින් දැක්වෙන සාධාරණ මූල්‍ය වටිනාකමෙන් යුත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ කල් පිරීම තෙක් තබාගනු ලබන ආයෝජන විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය නිශ්චයකරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් ආරම්භයේදී පිළිගනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමට සාධාරණ වටිනාකම නොවන වත්කම් සම්බන්ධයෙන් වන විට ලාභාලාභ ගිණුම මඟින් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු කිරීමේ පිරිවැයද එකතු කිරීම මඟිනි.

ශ්‍රී ලංගමයේ මූල්‍ය වත්කම්වලට, මුදල් සහ කෙටි කාලීන ආයෝජනද, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දේවල්ද, කාර්යය මණ්ඩල ණය සහ වෙනත් ලැබිය යුතු දේවල්ද ඇතුළත්වේ.

### 3.8.2 තදනන්තර මැනීම

මූල්‍යවත්කම් තදනන්තරව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතියි.

**(අ) ලාභාලාභ ගිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්**

ලාභාලාභ ගිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්වලට වෙළෙඳාම සඳහා තබාගනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභාලාභ ගිණුම් මඟින් සාධාරණ වටිනාකම මත ආරම්භක පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ලබාගෙන ඇත්තේ විකිණීම සඳහා හෝ නුදුරු කාලයේදී නැවත මිලට ගැනීම සඳහා නම්, එම වත්කම් වෙළෙඳාම සඳහා ලබා ගනු ලබන වත්කම්වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

**(ආ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ වූ කලී සක්‍රිය වෙළෙඳපලක මිල ඉදිරිපත් නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන්නේය. ආරම්භක ගණනයෙන් අනතුරුව එබඳු මූල්‍ය වත්කම් හානියට පත්වීම අඩු කළ ඵලදායී පොළී ප්‍රමාණ ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මත තදනන්තරව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්පත් කර ගැනීමේ යම් වට්ටමක් හෝ පරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අත්‍යාවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය ගැනද සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂය, ආදායම් ප්‍රතිශතයෙහි මූල්‍ය ආදායමෙහි ඇතුළත් කර තිබේ.

හානියට පත්වීමෙන් පැන නඟින අලාභ, ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයෙහි පිළිගනු ලැබේ.

**(ඇ) කල්පිරීම දක්වා තබාගනු ලබන ආයෝජන**

නියමිත හෝ නිශ්චය කරනු ලැබීමට හැකි ගෙවීම් සහ නියමිත කල් පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඒවා කල්පිරීම දක්වා තබා ගැනීමේ ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ශ්‍රී ලංගමයට තිබෙන විට කල්පිරීම දක්වා ලබා ගනු ලබන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.ආරම්භක ගණනයෙන් අනතුරුව කල්පිරීම දක්වා ලබා ගනු ලබන ආයෝජන ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් හානිය අඩු කොට ක්‍රමක්ෂ පිරිවැයට අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්කර ගැනීමට අදාල යම් වට්ටමක් හෝ පාරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අවශ්‍ය කොටසක් සහ ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂයන්ට ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායමද ඇතුළත්වේ. හානියට පත්වීමෙන් පැන නඟින අලාභ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගනු ලැබේ.

**(ඈ) විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන**

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනවලට සාධාරණත්ව කොටස් සහ ණය සුරැකුම් ඇතුළත්වේ. විකිණීමට ඇති ආකාරය අනුව වර්ගීකරණය කරන ලද සාධාරණත්ව කොටස් ආයෝජන වනුයේ වෙළෙඳාම සඳහා තබා ඇති ලෙසවර්ගීකරණයකරනු ලැබුණේවත්, ලාභ අලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමක් ලෙස නම් කරනු ලැබුණේවත් නොමැති ආයෝජනයන්ය. මෙම ගණයට අයත් ණය සුරැකුම් වනුයේ අනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරනු ලබන්නාවූද, ද්‍රවශීලතා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳපොල තත්ත්වයන්ගේ වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් හෝ විකුණනු ලැබිය හැකි සුරැකුම්ය.

ආරම්භක ගණනය කිරීමෙන් අනතුරුව විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනයන් ආයෝජනය පිළිගැනීම ඉවත් කර ගනු ලබන තෙක් විකිණීමට තිබෙන සංචිතයේ සෙසුපූර්ණආදායම් ලෙස පිළිගන්නා ලද උපලබ්ධි නොවූ ලැබීම් හෝ අලාභ සමඟ සාධාරණ වටිනාකමකට පසුව ගණනය කරනු ලැබේ.

### 3.8.3 පිළිගැනීම ඉවත් කිරීම

i. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇති විට,

ii. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට තමන්ට තිබෙන අයිතිවාසිකම් ශ්‍රී ලංගම විසින් පවරා දී ඇති විට හෝ ලැබුණු මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම සැලකිය යුතු තරමේ ප්‍රමාණයකින් තොරව එතෙරවීමේ වැඩ පිළිවෙලක් යටතේ තුන්වන පාර්ශවයකට ගෙවීමේ බැඳීමකට එළඹී ඇතිවිට සහ

(අ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම විසින් පවරාදී ඇත්තාවූ හෝ

(ආ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම පවරාදී හෝ රඳවාගෙන නොමැති, එහෙත් වත්කමෙහි පාලනය පවරා දී ඇති අවස්ථාවකදී

මූල්‍ය වත්කමක් හෝ (අදාල අවස්තාවකදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ එක සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක්) පිළිගැනීමෙන් ඉවත් කරනු ලැබේ.

### 3.8.4 මූල්‍ය වත්කම් හානියට පත්වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වී ඇති බවට යම් විෂය මූල සාක්ෂියක් තිබේද යන බව වාර්තා කරන එක් එක් දිනයකදී ශ්‍රී ලංගම විසින් තක්සේරු කරනු ලැබේ. වත්කමේ ආරම්භක පිළිගැනීමට පසුව සිදු වූ සිද්ධි එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණක් සහ අලාභ සිද්ධිය මඟින්

විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි බලපෑමක් ඇති කෙරේ නම් යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වූ ලෙස සලකනු ලැබේ. ණයකරු හෝ ණයකරුවන් කණ්ඩායම සැලකිය යුතු තරමේ මූල්‍ය දුෂ්කරතාවයන් පැහැරහැරීම් හෝ අපචාරවලට යටත්වීමේ සහ ඔවුන් වස්තු භංගත්වයට පත්වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යටත්වීමේ සම්භාවිතාවය අත්දැකීම් සහ පැහැරගැනීම්වලට සම්බන්ධ ආර්ථික තත්ත්වයක් පිළිබඳ වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි ගණනය කළ හැකි තරම් පහත වැටීමක් තිබෙන බව නිරීක්ෂණය කළ හැකි දත්තවලින් දැක්වෙන බවට ඇඟවීම්ද, හානියට පත්වීම් පිළිබඳ සාක්ෂිවලට ඇතුළත්ව විය හැකිය.

### 3.9 මුදල් සහ මුදල් සමානයන්

මුදල් සහ මුදල් සමානයන් සමන්විත වන්නේ මුදල් ශේෂ, ඉල්ලුම් තැන්පතු, මුදල්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කරනු ලැබිය හැකි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා ඉල්ලූවිට ආපසු ගෙවිය යුතු බැංකු අයිරා අඩු කළ විට වටිනාකම වෙනස්වීමේ නොවැදගත් අවදානමට යටත් අධික ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජන වලිනි.

### 3.10 මූල්‍ය බැරකම්

අංක 39 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විෂය පථය තුළ මූල්‍ය බැරකම්වල ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම ලාභාලාභ ගිණුම මගින් ක්‍රමක්ෂ පිරිවැය මත සාධාරණ වටිනාකමෙන් යුත් මූල්‍ය බැරකම් ලෙස හෝ අදාල පරිදි ඵලදායක රැකවරණයකදී රැකවරණ සාධාරණ පත්‍ර ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්වකීය මූල්‍ය බැරකම් ආරම්භයේදී පිළිගැනීම පිළිබඳ වර්ගීකරණය ශ්‍රී ලංගම විසින් නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය බැරකම් ආරම්භයේදී සාධාරණ වටිනාකම මත පිළිගනු ලබන අතර, ණය සහ ඉල්ලා ගත් මුදල් ක්‍රමක්ෂ පිරිවැය මත ඉදිරියට ගෙන යනු ලැබේ. ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ශ්‍රී ලංගමයේ මූල්‍ය බැරකම්වලට ඇතුළත් වේ.

#### 3.10.1 තදනන්තර ගණනය කිරීම

මූල්‍ය බැරකම් පිළිබඳ තදනන්තර ගණනය කිරීම් කරනු ලබන්නේ ක්‍රමක්ෂ පිරිවැය මතය.

#### 3.10.2 පිළිගැනීම ඉවත් කිරීම

බැරකම් යටතට වැටෙන බැඳීමක් බේරුම් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ අවසන් වන අවස්ථාවේදී මූල්‍ය බැරකම් පිළිගැනීම ඉවත් කෙරෙන්නේය.

### 3.11 මූල්‍ය සාධන හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන්නේ සහ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන්නේ පිළිගන්නා ලද මුදල් ගණන් හිලව් කිරීමට වර්තමානයේ ක්‍රියාත්මක කළ හැකි නෛතික අයිතිවාසිකමක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ සමගාමීව වත්කම් උපලබ්ධි කරගැනීමට සහ බැරකම් නිරවුල් කිරීමට චේතනාවක් තිබෙන්නේ නම් පමණකි.

## 3.12 පශ්චාත් රැකියා ප්‍රතිලාභ

### 3.12.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සමාගම

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ නියමිත පරිදි සුදුසුකම් ඇති සියලුම සේවකයන් සඳහාවූ ප්‍රතිලාභ සැලැස්ම මණ්ඩලය විසින් යොදා ගනු ලැබ ඇත. ප්‍රතිලාභ සැලැස්ම සඳහා බැහැරින් අරමුදල් සපයනු නොලැබේ.සේවය කළ සෑම වර්ෂයක් සඳහාම එක් මසක වැටුපක් විශ්‍රාම ගැන්වීමේදී සේවකයන්ට ලබා දෙනු ලැබේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පිළිගනු ලැබ ඇති බැරකම වනුයේ, වාර්තා කරන දිනයේදී ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකමයි. මේ අයිතමය සඳහන් කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම නොවන බැරකම් යටතේය. ආයු ගණන වාසි හෝ අලාභ එය පැන නඟින මූල්‍ය වර්ෂය තුළ ආදායමක් හෝ වියදමක් ලෙස සෙසු පූර්ණ ආදායමෙහි පිළිගනු ලැබේ.

### 3.12.2 අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල්වලට සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල්වලට සුදුසුකම් ඇති සියලුම සේවකයින් අදාල ව්‍යවස්ථාවලට අනුකූලව අදාල දායකත්ව අරමුදල්වලින් ආවරණය කෙරේ. අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්වලට ගෙවන සේවා යෝජකයාගේ දායක මුදල් ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

## 3.13 වෙළෙඳ සහ කළ යුතු වෙනත් ගෙවීම්

වෙළෙඳ සහකළ යුතු වෙනත් ගෙවීම් පිරිවැය අනුව දක්වනු ලැබේ.

## 3.14 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස විශ්වාස කටයුතුව ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ අනුමිත බැඳීමක් මණ්ඩලයට තිබේ නම් සහ බැඳීම ඉටු කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ බැහැරට ගලා යෑමක අවශ්‍යතාවය සම්භාවී වන්නේ නම් යම් ප්‍රතිදානයක් පිළිගනු ලැබේ.

## 3.15 සෙමෙන් අලෙවි වන තොග සඳහා ප්‍රතිපාදන

බඩු වට්ටෝරු පිළිබඳව මණ්ඩලය විසින් නිතිපතා කරනු ලබන තක්සේරුවලදී වට්ටෝරු භාණ්ඩ හානියට පත්වීම මණ්ඩලය හඳුනාගනු ලැබූ විට සෙමෙන් අලෙවි වන තොග සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ.

## 3.16 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත බැරකම්

අවිනිශ්චිත බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ පැවරීමට සම්භාවී නොවන හෝ විශ්වාස කටයුතු ලෙස ගණනය කරනු ලැබිය නොහැකි අවස්ථාවලදී ඇතැම් අනාගත සිද්ධි හෝ වර්තමාන බැඳීම් මඟින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විභව බැඳීම් වන්නේය.

**පූර්ණ ආදායම් ප්‍රකාශය**

## 3.17 ආදායම

මණ්ඩලයේ ආදායම සමන්විත වන්නේ මගී ප්‍රවාහනය මඟින් ලැබෙන ආදායමෙනි.

### 3.17.1 ආදායම පිළිගැනීම

ආදායම පිළිගනු ලබන්නේ ආර්ථිකප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා එනු ඇතැයි සම්භාවීවන්නාවූ, ආදායම සහ දරන ලද හෝ දැරීමට තිබෙන ආශ්‍රිත පිරිවැය විශ්වාස කටයුතු ලෙස ගණනය කළ හැකි වන්නාවූ ප්‍රමාණයටය. ආදායම ගණනය කරනු ලබන්නේ ලැබුණු හෝ ලැබීමට ඇති ප්‍රතිශ්ඨාවේ සාධාරණ වටිනාකමෙන් වෙළෙඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කොට මණ්ඩලය තුළ විකුණුම් බැහැර කිරීමෙන් අනතුරුවය.

**(අ) භාණ්ඩ විකිණීම**

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරීත්වයේ සැලකිය යුතු තරම් වූ අවදානම් සහ ප්‍රදානයන් සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදෙන අවස්ථාවේදී ගැණුම්කරු වෙත මාරු වූ විටය.

**(ආ) සේවාවන් ඉටු කිරීම**

සේවාවන් සැපයීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ සේවාවන් සපයනු ලබන හෝ ඉටු කරනු ලබන කාල පරිච්ජේදය තුළදීය.

**(ඇ) වෙනත් ආදායම්**

ලාභාංශවලින් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ ගෙවීම් ලැබීමට මණ්ඩලයට තිබෙන අයිතිවාසිකම තහවුරු කරනු ලැබූ විටදීය.

දේපල, පිරියත සහ උපකරණ අපහරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අපහණයෙන් ලැබෙන මුදලින් වත්කම්වල ධාරක වටිනාකමෙන් සහ ඒ සම්බන්ධ වියදම්වලින් අඩු කරනු ලැබ පිළිගනු ලැබේ.

විදේශ මුදල් ඉපැයුම් සහ අලාභ ශුද්ධ පදනමක් මතවාර්තාකරනු ලැබේ.

අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරීත්වයේ සැලකිය තරම්වූ අවදානම් සහ ප්‍රදානයන් සාමාන්‍යයෙන් භාණ්ඩ භාර දෙන අවස්ථවේදී ගැණුම්කරු වෙත මාරු වූ විටදීය.

ආයෝජන දේපල මත ක්‍රියාත්මක වන කල්බදුවලට ලැබෙන කුලී ආදායම කල්බදු කාලය පුරා සරල රේඛා පදනමක් මත ගිණුම්ගත කරනු ලැබේ.

## 3.18 ආණ්ඩුවේ ආධාර මුදල්

ආධාර මුදල් භාර ගන්නා බවට සහ ඊට අදාල කොන්දේසි සියල්ලක්මඉටු කරනු ලබන බවට සාධාරණ සහතිකයක් තිබෙන අවස්ථාවලදී ආණ්ඩුවේ ආධාර මුදල් පිළිගනු ලැබේ. ආධාර මුදල වියදම් අයිතමයක් හා සම්බන්ධ වන අවස්ථාවකදී එය හානිපූර්ණයකිරීමට අපේක්ෂා කරන පිරිවැය වියදම් කරනු ලබන කාල පරිච්ජේද පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

ආධාර මුදල වත්කමක් හා සම්බන්ධ වන විට, එය අදාල වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සමාන කොටස්වලින් ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

ශ්‍රී ලංගමට මූල්‍ය නොවන ආධාර ලැබෙන විට වත්කම හා ආධාර මුදල නාමික මුදල් ගණන් අනුව වාර්තාගත කරනු ලබන අතර අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පාදක වූ වත්කමෙහි ප්‍රතිලාභයෙහි පරිභෝජන රටාවට අනුව සමාන වාර්ෂික කොටස්වලින් ලාභයට හෝ අලාභයට මුදා හරිනු ලැබේ. පවත්නා අදාල වෙළෙඳපොල පොළී ප්‍රමාණයට අඩු පොළී ප්‍රමාණයන් මත ආණ්ඩුව හෝ සම්බන්ධ ආයතන විසින් ණය හෝ ඊට සමාන ආධාර ලබා දෙනු ලබන විට මෙම වාසිදායක පොළිය ආණ්ඩුවෙන් ලැබෙන ආධාරයක් ලෙස සලකනු ලැබේ.

## 3.19 වියදම් පිළිගැනීම

### 3.19.1 ක්‍රියාත්මක කිරීමේ වියදම්

ව්‍යාපාරයේ එදිනෙදා කටයුතුවලදී හා දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වාගෙන යන යාමේදී දරන සියලුම වියදම් වර්ෂයේ ලාභය ගණන් බැලීමේදී පූර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබ ඇත. මූල්‍ය වත්කම් හානියට පත්වීම සෙමෙන් අලෙවි වන තොග දන්නා සියලුම බැරකම් හා දේපල, පිරියල සහ උපකරණ ක්ෂය කිරීම සඳහාද ප්‍රතිපාදන සලස්වා තිබේ.

### 3.19.2 කල්බදු ගෙවීම්

ක්‍රියාත්මකව පවතින කල්බදු යටතේ කරනු ලබන ගෙවීම් කල්බදු කාලපරිච්ජේදය තුළ සරල රේඛා පදනම මත ලාභාලාභ ගිණුමේ පිළිගනු ලැබේ.

මූල්‍ය කල්බදු යටතේ කරනු ලබන අවම කල්බදු ගෙවීම, මූල්‍ය වියදම සහ හිඟව පවත්නා බැරකමේ අඩුවීම අතරේ අනුපාතිකව බෙදා වෙන් කරනු ලැබේ. බැරකමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ කාලීන පොළී ප්‍රමාණයක් ඇති වන පරිදි මූල්‍ය වියදම කල්බදු කාල පරිච්ජේදය තුළ එක් එක් කාල පරිච්ජේදය සඳහා වෙන් කරනු ලැබේ.

### 3.19.3 ණයට ගැනීමේ පිරිවැය

වත්කමක අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා එය සූදානම් කිරීම පිණිස අත්‍යාවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගත වන වත්කම් අත්කර ගැනීම ඉදිකිරීම හෝ නිෂ්පාදන සඳහා ඍජුවම ආරෝපණය කළ හැකි ණයට ගැනීමේ පිරිවැය අදාල වත්කම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ. පොළිය සහ අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලය දරන සෙසු පිරිවැය ණයට ගැනීමේ පිරිවැයට ඇතුළත් වේ.

### 3.19.4 ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම

මූල්‍ය ආදායම සමන්විත වන්නේ ආයෝජනය කරන ලද අරමුදල් සහ කාර්යයමණ්ඩල ණය මත ලැබෙන පොළී ආදායම සහ ලාභාලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමට අනුව මූල්‍ය සම්පත්වල සාධාරණ වටිනාකමේ සිදුවන වෙනස්කම්වලිනි. පොළී ආදායම ලාභාලාභ ගිණුමේ උපචිත වන ආකාරයට ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් පිළිගනු ලැබේ.

මූල්‍යපිරිවැය සමන්විත වන්නේ ණය ගැනීම් මත පොළී වියදම් ප්‍රතිපාදන මත වට්ටම් ලිහිල් කිරීම ලාභාලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමට අනුව මූල්‍ය සම්පත්වල සාධාරණ වටිනාකමේ සිදුවන වෙනස්කම් මූල්‍ය වත්කම් මත පිළිගන්නා ගන්නා ලද හානිකාරක අලාභ සහ සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කරගැනීමට, ඉදිකිරීමට හෝ නිෂ්පාදනය කිරීමට ඍජුව ආරෝපණය කළ නොහැකි ණය ගැනීම් පිරිවැය යනාදියෙන් වන අතර ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභාලාභ ගිණුමේ පිළිගනු ලැබේ.

## 3.20 සම්බන්ධ පාර්ශව ගනුදෙනු

එක්පාර්ශවයකට අනෙක් පාර්ශවය සම්බන්ධයෙන් මූල්‍ය සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති තීරණ කෙරෙහි පාලනය කිරීමේ හෝ සැලකිය යුතු තරමේ බලපෑම් කිරීමේ හැකියාවක් ඇති ගනුදෙනු සම්බන්ධයෙන් මිළක් අය කරගනු ලැබේද නැද්ද යන බව නොසලකාම එළිදරව් කිරීම් සිදු කර තිබේ.

## 3.21 මුදල් ප්‍රවාහය

“ වක්‍ර ක්‍රමය ” භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ලැබුණු පොළිය සහ ලැබුණු ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, ගෙවන ලද ලාභාංශ සහ ගෙවන ලද ලාභාංශ සහ ගෙවන ලද පොළිය මූල්‍යකරණ මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත.

## 3.22 වාර්තා කිරීමෙන් පසුව සිදුවන සිද්ධි

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවන සිද්ධින් යනු වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර දෙනු ලැබූ දිනය අතරතුර සිදුවන වාසිසහගත සහ වාසිසහගත නොවන සිද්ධීන්ය.

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම්වල වැදගත්කම සැලකිල්ලට ගනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශවල සුදුසු ගැලපීම් හෝ එළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
### 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි )

| වත්කම් | සටහන් | දෙසැම්බර් 31 2020 | දෙසැම්බර් 31 2019 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 01 | 7,083,280,977.22 | 9,174,029,658.88 |
| වෙනත් මූල්‍ය වත්කම් | 02 | 26,906,250.00 | 25,000,000.00 |
| කෙරීගෙන යන වැඩ | | 42,372,869.98 | 26,569,098.30 |
| අක්‍රිය ගිණුම | 03 | 1,290,782,781.62 | 1,290,782,781.62 |
| | | **8,443,342,878.82** | **10,516,381,538.80** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 04 | 1,696,207,318.88 | 1,680,585,239.13 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු | 05 | 2,864,130,067.71 | 2,875,523,617.50 |
| වෙනත් මූල්‍ය වත්කම් | 06 | 1,131,363,974.06 | 1,071,901,706.06 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 07 | 2,742,229,957.14 | 3,522,440,758.78 |
| **මුළු ජංගම වත්කම්** | | **8,433,931,317.79** | **9,150,451,321.47** |
| **මුළු වත්කම්** | | **16,877,274,196.61** | **19,666,832,860.27** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ස්කන්ධය හා සංචිත** | | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | | 350,000,000.00 | 350,000,000.00 |
| සමුච්චිත අලාභය | 08 | (44,135,887,622.78) | (42,011,553,749.77) |
| භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය | | 3,944,890,550.00 | 3,944,890,550.00 |
| සේවක කොටස් | | 411,144,470.00 | 411,144,470.00 |
| රජයේ ප්‍රතිදාන | 09 | 3,300,557,519.78 | 2,981,392,312.95 |
| සංචිත | 10 | 5,470,757,941.77 | 5,470,757,941.77 |
| විකිණීම සඳහා ඇති සංචිත | | 26,656,250.00 | 24,750,000.00 |
| **මුළු ස්කන්ධය** | | **(30,631,880,891.23)** | **(28,828,618,475.05)** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 11 | 13,450,587,559.71 | 13,593,105,638.09 |
| වෙනත් ජංගම නොවන වගකීම් | 12 | 3,860,454,904.02 | 4,411,280,894.22 |
| අක්‍රිය ගිණුම | 13 | 18,526,264,783.02 | 18,526,264,783.02 |
| | | **35,837,307,246.75** | **36,530,651,315.33** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 14 | 11,524,081,084.92 | 11,725,356,464.65 |
| බැංකු අයිරාව | 07 | 147,766,756.17 | 239,443,555.34 |
| **මුළු ජංගම වගකීම්** | | **11,671,847,841.09** | **11,964,800,019.99** |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | **16,877,274,196.61** | **19,666,832,860.27** |

01 සිට 21 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්යය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

| | | |
|---|---|---|
| Chairman<br>Sri Lanka Transport Board<br>Kingsley Ranawaka<br>Chairman<br>Sri Lanka Transport Board | Deputy General Manager<br>Sri Lanka Transport Board<br>M.G.A. Mangala Jayathilaka | Member of Director Board<br>Sri Lanka Transport Board<br>Board Director<br>Sri Lanka Transport Board |
| සභාපති,<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය),<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය. | අධ්‍යක්ෂක මණ්ඩල සමාජික,<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය. |

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

## 2020 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි )*

| | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|
| ආදායම | 15 | 24,562,341,758.99 | 35,737,094,498.55 |
| මෙහෙයුම් වියදම් | 16 | 28,675,750,034.96 | 36,592,797,521.84 |
| ක්ෂයකිරීම්වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය) | | **(4,113,408,275.97)** | **(855,703,023.29)** |
| වෙනත් ආදායම් | 17 | 6,382,319,726.77 | 6,947,823,732.03 |
| වෙනත් ආදායම් ගැලපීමෙන් පසු ලාභය /(අලාභය) | | **2,268,911,450.80** | **6,092,120,708.74** |
| පරිපාලන වියදම් | 18 | 5,355,665,246.92 | 6,940,996,226.40 |
| ක්ෂයවලට පසු මෙහෙයුම් ලාභය / (අලාභය) | | **(3,086,753,796.12)** | **(848,875,517.66)** |
| මූල්‍ය හා වෙනත් වියදම් | 19 | 264,255,275.96 | 384,432,888.01 |
| මූල්‍ය ආදායම් | | 184,884,183.17 | 254,290,570.50 |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | | **(79,371,092.79)** | **(130,142,317.51)** |
| නිෂ්පාදන අලාභයට පෙර ලාභ / (අලාභ) | | **(3,166,124,888.91)** | **(979,017,835.17)** |
| නිෂ්පාදන අලාභය | 20 | 66,237,243.79 | 20,172,420.21 |
| රාජ්‍ය ප්‍රතිපාදන හා වෙන්කිරීම්වලට පෙර ලාභ / (අලාභ) | | **(3,232,362,132.70)** | **(999,190,255.38)** |
| රාජ්‍ය ප්‍රතිපාදන හා වෙන්කිරීම් | 21 | 1,127,367,737.76 | 1,473,921,845.00 |
| වර්ෂයේ ශුද්ධ ලාභ / (අලාභය) | | **(2,104,994,394.94)** | **474,731,589.62** |
| <u>වෙනත් විස්තීර ආදායම්</u> | | | |
| මූල්‍ය වත්කම්වල ශුද්ධ සාධාරණ වටිනාකම (AFS) | | 1,906,250.00 | (625,000.00) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර ආදායම්** | | **1,906,250.00** | **(625,000.00)** |
| **වර්ෂය සඳහා මුළු විස්තීර ආදායම** | | **(2,103,088,144.94)** | **474,106,589.62** |

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| *(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි )* | **2020** | **2019** |
|---|---|---|
| **<u>මෙහෙයුම් කටයුතු තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය</u>** | | |
| ශුද්ධ ලාභය/ (අලාභය) | (2,104,994,395) | 1,890,458,961 |
| **<u>ගැලපීම්</u>** | | |
| ක්‍ෂය | 2,507,395,399 | 2,265,408,864 |
| ලාභ/ අලාභ ගැලපුම් | (19,339,478) | 1,023,658,667 |
| රජයේ ප්‍රතිදාන - වර්ෂය තුල නිදහස් කරන ලද | (1,127,367,738) | (1,473,921,845) |
| පොලී ආදායම | (184,884,183) | (254,290,571) |
| මූල්‍ය පිරිවැය | 264,255,276 | 384,432,888 |
| බස් රථ ඉවත් කිරීමේ ලාභය | - | (41,673,000) |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 831,270,451 | (139,569,908) |
| **මෙහෙයුම් ලාභය/(අලාභය) මෙහෙයුම් ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර** | **166,335,332** | **3,654,504,056** |
| තොගය වැඩිවීම්/ අඩුවීම් | (15,622,080) | (246,653,341) |
| ලැබිය යුතු වෙළෙඳ හා වෙනත් ලැබීම් වැඩිවීම් / අඩුවීම් | 11,393,550 | (393,103,266) |
| අත්තිකාරම් වැඩිවීම්/ අඩුවීම් | - | - |
| කෙරිගෙන යන වැඩ ඕැඩිවීම්/ අඩුවීම් | (15,803,772) | (7,772,876) |
| ණයහිමියෝ වැඩිවීම්/ අඩුවීම් | 343,407,781 | 867,603,317 |
| උපචිත වියදම් වැඩිවීම්/ අඩුවීම් | (527,284,220) | (1,376,643,012) |
| අනෙකුත් ජංගම නොවන වගකීම් වැඩිවීම්/අඩුවීම් | | 2,123,697,122 |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | **(37,573,409)** | **4,621,632,000** |
| පාරිතෝෂික ගෙවීම් | (973,788,530) | (1,259,953,938) |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,011,361,939)** | **3,361,678,062** |
| **ආයෝජන කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත අත්පත් කර ගැනීම් | (416,646,717) | (2,678,314,349) |
| ඉවත් කිරීම හා විකිණීම තුලින් ලැබෙන මුදල් | - | 41,921,000 |
| ආයෝජන අත්පත් කර ගැනීම් | (59,462,268) | (362,730,391) |
| පොලී ආදායම | 184,884,183 | 254,290,571 |
| **ආයෝජන කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(291,224,802)** | **(2,744,833,169)** |
| **මූල්‍ය කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| මූල්‍ය ගෙවීම් | (50,494,933) | (282,310,354) |
| රජයේ ප්‍රතිදාන ලැබීම් | 1,446,532,945 | 1,473,921,845 |
| ශුද්ධ සංචලන කල්බදු ණයහිමි/කල්බදු ගෙවීම් | (781,985,273) | (2,362,625,213) |
| **මූල්‍ය කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | **614,052,738** | **(1,171,013,722)** |
| මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන් (අඩුවීම/වැඩිවීම) | **(688,534,002)** | **(554,168,730)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන අයිතම | **3,282,997,203** | **3,837,165,933** |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල්වලට සමාන අයිතම | **2,594,463,201** | **3,282,997,203** |

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## *2020 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය*

***(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි )***

| | ස්කන්ධ ප්‍රාග්ධනය | සේවක කොටස් | රජයේ ප්‍රතිදාන | සංචිත | භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය | විකිණීම සදහා ඇති සංචිත | සමුච්චිත ලාභය/ අලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2018.12.31** දිනට ශේෂය | 350,000,000.00 | 411,144,470.00 | 2,981,392,312.95 | 5,470,757,941.77 | 3,944,890,550.00 | 24,750,000.00 | (40,595,826,378.47) | (27,412,891,103.75) |
| ආරම්භක ශේෂයට කල ගැලපුම් | | | | | | | | - |
| වර්ෂයේ එකතු කිරීම් | | | - | | | | | - |
| වර්ෂයේ ඉවත් කිරීම් | | | - | | | | (1,435,066,849.37) | (1,435,066,849.37) |
| **2019.12.31** දිනට ගැලපුම් කරන ලද ශේෂය | **350,000,000.00** | **411,144,470.00** | **2,981,392,312.95** | **5,470,757,941.77** | **3,944,890,550.00** | **24,750,000.00** | **(42,030,893,227.84)** | **(28,847,957,953.12)** |
| වර්ෂයේ එකතු කිරීම් | - | - | 354,628,007.59 | - | - | | | 354,628,007.59 |
| වර්ෂයේ ඉවත් කිරීම් | - | - | (35,462,800.76) | - | - | - | (2,104,994,394.94) | (2,140,457,195.70) |
| විස්තරාත්මක ආදායම් ලාභය/අලාභය | | | | | | 1,906,250.00 | | 1,906,250.00 |
| **2020.12.31** දිනට ශේෂය | **350,000,000.00** | **411,144,470.00** | **3,300,557,519.78** | **5,470,757,941.77** | **3,944,890,550.00** | **26,656,250.00** | **(44,135,887,622.78)** | **(30,631,880,891.23)** |

**01.**දේපල පිරියත හා උපකරණ

නිදහස් දේපල

| | ඉඩම් හා ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | මෝටර් රථ | ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන | වායු සමීකරණ | පරිගණක | බස්රථ |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | 378,104,967.74 | 262,480,657.54 | 186,335,694.20 | 300,449,252.76 | 1,041,195.32 | 14,107,020.69 | 140,378,736.80 | 14,577,640,549.36 |
| <u>ගැලපුම්</u> | | | | | | | | |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2019.12.31 දිනට ශේෂය | **378,104,967.74** | **262,480,657.54** | **186,335,694.20** | **300,449,252.76** | **1,041,195.32** | **14,107,020.69** | **140,378,736.80** | **14,577,640,549.36** |
| එකතු කිරීම් | 9,282,341.98 | 388,934,715.38 | 6,384,484.39 | - | - | 526,520.00 | 2,070,295.00 | - |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය | **387,387,309.72** | **651,415,372.92** | **192,720,178.59** | **300,449,252.76** | **1,041,195.32** | **14,633,540.69** | **142,449,031.80** | **14,577,640,549.36** |

**<u>කල්බදු වත්කම්</u>**

| | ඉඩම් හා ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | මෝටර් රථ | ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන | වායු සමීකරණ | පරිගණක | බස්රථ |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | | | | | | | | 12,343,801,671.84 |
| <u>ගැලපුම්</u> | | | | | | | | |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2019.12.31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **12,343,801,671.84** |
| එකතු කිරීම් | | | | | | | | - |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **12,343,801,671.84** |

**01.**දේපල පිරියත හා උපකරණ

නිදහස් දේපල

| | ඉඩම් හා ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | මෝටර් රථ | ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන | වායු සමීකරණ | පරිගණක | බස්රථ |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | 378,104,967.74 | 262,480,657.54 | 186,335,694.20 | 300,449,252.76 | 1,041,195.32 | 14,107,020.69 | 140,378,736.80 | 14,577,640,549.36 |
| ගැලපුම් | | | | | | | | |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2019.12.31 දිනට ශේෂය | **378,104,967.74** | **262,480,657.54** | **186,335,694.20** | **300,449,252.76** | **1,041,195.32** | **14,107,020.69** | **140,378,736.80** | **14,577,640,549.36** |
| එකතු කිරීම් | 9,282,341.98 | 388,934,715.38 | 6,384,484.39 | - | - | 526,520.00 | 2,070,295.00 | - |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය | **387,387,309.72** | **651,415,372.92** | **192,720,178.59** | **300,449,252.76** | **1,041,195.32** | **14,633,540.69** | **142,449,031.80** | **14,577,640,549.36** |

කල්බදු වත්කම්

| | ඉඩම් හා ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | මෝටර් රථ | ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන | වායු සමීකරණ | පරිගණක | බස්රථ |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | | | | | | | | 12,343,801,671.84 |
| ගැලපුම් | | | | | | | | |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2019.12.31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **12,343,801,671.84** |
| එකතු කිරීම් | | | | | | | | - |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **12,343,801,671.84** |

**නිදහස් දේපල**

**ක්ෂය**

| | ඉඩම් හා ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | මෝටර් රථ | ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන | වායු සමීකරණ | පරිගණක | බස්රථ |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | 164,314,644.18 | 149,837,519.27 | 135,950,576.51 | 261,597,050.63 | 520,385.32 | 5,704,993.51 | 74,804,371.28 | 11,049,796,496.02 |
| <u>ගැලපුම්</u> | | | | | | | | |
| එකතු කිරීම් | | - | - | | | | - | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2019.12.31 දිනට ශේෂය | **164,314,644.18** | **149,837,519.27** | **135,950,576.51** | **261,597,050.63** | **520,385.32** | **5,704,993.51** | **74,804,371.28** | **11,049,796,496.02** |
| වර්ෂයේ ක්ෂය | 1,569,663.85 | 38,550,745.47 | 8,140,277.42 | 11,630,339.50 | - | 1,144,194.71 | 26,133,711.61 | 349,042,005.85 |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය | **165,884,308.03** | **188,388,264.74** | **144,090,853.93** | **273,227,390.13** | **520,385.32** | **6,849,188.22** | **100,938,082.89** | **11,398,838,501.87** |

**කල්බදු වත්කම්**

| | ඉඩම් හා ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍රෝපකරණ | කාර්යාල උපකරණ | මෝටර් රථ | ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන | වායු සමීකරණ | පරිගණක | බස්රථ |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | | | | | | | | 7,906,830,779.16 |
| <u>ගැලපුම්</u> | | | | | | | | |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2019.12.31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **7,906,830,779.16** |
| වර්ෂයේ ක්ෂය | | | | | | | | 1,794,257,024.95 |
| එකතු කිරීම් | | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **9,701,087,804.11** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **මුලු වත්කම්** | **387,387,309.72** | **651,415,372.92** | **192,720,178.59** | **300,449,252.76** | **1,041,195.32** | **14,633,540.69** | **142,449,031.80** | **26,921,442,221.20** |
| **මුලු ක්ෂය කිරීම්** | **165,884,308.03** | **188,388,264.74** | **144,090,853.93** | **273,227,390.13** | **520,385.32** | **6,849,188.22** | **100,938,082.89** | **21,099,926,305.98** |
| **ශුද්ධ පොත් අගය** | **221,503,001.69** | **463,027,108.18** | **48,629,324.66** | **27,221,862.63** | **520,810.00** | **7,784,352.47** | **41,510,948.91** | **5,821,515,915.22** |

| | ගර්භිත බස්රථ | තුවක්කු | බස්රථ එන්ජින් | ටිකට් මැෂින් | වෙනත් වත්කම් | පරිසණක මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | 1,367,754,792.20 | 34,750.00 | 1,563,027,643.31 | 174,532,229.13 | 26,623,928.71 | 14,091,677.19 | 14,988,591,057.26 |
| <u>ගැලපුම්</u> | | | | | | | - |
| එකතු කිරීම් | - | | | | - | | - |
| | | | | | | | - |
| ඉවත් කිරීම් | | | | | | | - |
| **2019.12.31 දිනට ශේෂය** | **1,367,754,792.20** | **34,750.00** | **1,563,027,643.31** | **174,532,229.13** | **26,623,928.71** | **14,091,677.19** | **14,988,591,057.26** |
| වර්ෂයේ ක්ෂය | - | - | 226,338,436.05 | 39,098,386.57 | 6,258,085.71 | 5,232,527.41 | 713,138,374.15 |
| එකතු කිරීම් | - | | | | | | - |
| ඉවත් කිරීම් | | | | | | | - |
| | | | | | | | - |
| **2020.12.31 දිනට ශේෂය** | **1,367,754,792.20** | **34,750.00** | **1,789,366,079.36** | **213,630,615.70** | **32,882,014.42** | **19,324,204.60** | **15,701,729,431.41** |

**කල්බදු වත්කම්**

| | ගර්භිත බස්රථ | තුවක්කු | බස්රථ එන්ජින් | ටිකට් මැෂින් | වෙනත් වත්කම් | පරිසණක මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | | | | | | | 7,906,830,779.16 |
| <u>ගැලපුම්</u> | | | | | | | - |
| එකතු කිරීම් | | | | | | | - |
| ඉවත් කිරීම් | | | | | | | - |
| | | | | | | | - |
| **2019.12.31 දිනට ශේෂය** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **7,906,830,779.16** |
| වර්ෂයේ ක්ෂය | | | | | | | 1,794,257,024.95 |
| එකතු කිරීම් | | | | | | | |
| ඉවත් කිරීම් | | | | | | | - |
| | | | | | | | - |
| **2020.12.31 දිනට ශේෂය** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **9,701,087,804.11** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **මුලු වත්කම්** | **1,367,754,792.20** | **34,750.00** | **2,137,819,740.64** | **266,417,397.14** | **70,599,232.98** | **31,934,196.78** | **32,486,098,212.74** |
| **මුලු ක්ෂය කිරීම්** | **1,367,754,792.20** | **34,750.00** | **1,789,366,079.36** | **213,630,615.70** | **32,882,014.42** | **19,324,204.60** | **25,402,817,235.52** |
| **ශුද්ධ පොත් අගය** | **-** | **-** | **348,453,661.28** | **52,786,781.44** | **37,717,218.56** | **12,609,992.18** | **7,083,280,977.22** |

| | පිරිවැය - ඉඩම් හා ගොඩනැගිලි | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| **101-1** | ඉඩම් හා ගොඩනැගිලි | 290,377,302.57 | 281,094,960.59 |
| **101-1-A** | ඉඩම් හා ගොඩනැඟිලි - වෙස්කො | 17,606,792.92 | 17,606,792.92 |
| **101-1-B** | ඉඩම් හා ගොඩනැඟිලි - ඩිපෝ/ ගරාජ් | 12,780,411.77 | 12,780,411.77 |
| **101-1-C** | ඉඩම් හා ගොඩනැගිලි - (තාවකාලික ගොඩනැඟිලි) | 540,742.70 | 540,742.70 |
| **101-1-D** | ඉඩම් හා ගොඩනැගිලි - (මහී ආවරණ) | 14,007,685.89 | 14,007,685.89 |
| **101-1-E** | ඉඩම් හා ගොඩනැගිලි - (වෙනත්) | 51,774,373.87 | 51,774,373.87 |
| **101-1-F** | ශ්‍රී ලංගම - ක්‍රීඩාපිටිය | 300,000.00 | 300,000.00 |
| | **එකතුව** | **387,387,309.72** | **378,104,967.74** |

| | පිරිවැය - මෝටර් රථ | | |
|---|---|---|---|
| **101-5-A** | වෑන්, ලොරි සහ වෙනත් රථ | 277,922,828.03 | 277,922,828.03 |
| **101-5-B** | කාර්, යතුරු පැදි සහ බයිසිකල් | 22,526,424.73 | 22,526,424.73 |
| | **එකතුව** | **300,449,252.76** | **300,449,252.76** |

| | සමුච්චිත ක්ෂය - ඉඩම් හා ගොඩනැඟිලි | | |
|---|---|---|---|
| **104-1-A** | ඉඩම් හා ගොඩනැගිලි - (තාවකාලික) | 540,742.70 | 540,742.70 |
| **104-1-B** | ඉඩම් හා ගොඩනැගිලි | 143,641,719.27 | 142,072,055.42 |
| **104-1-C** | ඉඩම් හා ගොඩනැඟිලි - වේරහැර | 8,742,038.00 | 8,742,038.00 |
| **104-1-D** | ඉඩම් හා ගොඩනැඟිලි - ඩිපෝ/ ගරාජ් | 5,947,599.68 | 5,947,599.68 |
| **104-1-E** | ඉඩම් හා ගොඩනැගිලි - (මහී ආවරණ) | 4,981,605.27 | 4,981,605.27 |
| **104-2** | ඉඩම් හා ගොඩනැගිලි - (වෙනත්) | 2,030,603.11 | 2,030,603.11 |
| | **එකතුව** | **165,884,308.03** | **164,314,644.18** |

**02.**වෙනත් මූල්‍ය වත්කම්

විකිණිය හැකි ආයෝජන

| ගිණුම් | විස්තරය | 31.12.2020 | | | 31.12.2019 | | |
|---|---|---|---|---|---|---|---|
| සංකේත | | කොටස් ගණන | පිරිවැය | වෙළෙඳ අගය | කොටස් ගණන | පිරිවැය | වෙළෙඳ අගය |
| **105-2-G** | ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම - කොටස් ආයෝජනය | 31,250 | 250,000.00 | **26,906,250.00** | 31,250 | 250,000.00 | **25,000,000.00** |
| | එකතුව | 31,250 | 250,000.00 | **26,906,250.00** | 31,250 | 250,000.00 | **25,000,000.00** |

-

| සටහන් | නොනිමි වැඩ | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 102-2 | 01.01.2020 දිනට ශේෂය | 26,569,098.30 | 18,796,222.31 |
| | එකතු කිරීම් | 15,803,771.68 | 7,772,875.99 |
| | 31.12.2020 දිනට ශේෂය | **42,372,869.98** | **26,569,098.30** |

**03.**අක්‍රිය ගිණුම්

| | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **203-2-13** | අක්‍රිය ගිණුම් - හර ශේෂය | 1,290,782,781.62 | 1,290,782,781.62 |
| | | **1,290,782,781.62** | **1,290,782,781.62** |

**04.**තොගය

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **106-1** | භාණ්ඩ තොගය | 1,635,165,408.85 | 1,513,522,729.47 |
| **106-2** | ඉන්ධන | 89,785,490.36 | 95,839,866.02 |
| **106-3** | ආයුධ හා උපකරණ | - | - |
| **106-4** | මාර්ගස්ථ තොගය | (40,135,862.07) | 69,713,130.27 |
| **106-6** | නොනිමි වැඩ - අමුද්‍රව්‍ය (ප්‍රාදේශීය වැඩපල) | 11,392,281.74 | 1,509,513.37 |
| | | **1,696,207,318.88** | **1,680,585,239.13** |
| **106-5** | හානියට පත් ගබඩා අයිතම සඳහා වෙන්කිරීම | - | |
| | එකතුව | **1,696,207,318.88** | **1,680,585,239.13** |

**05.** වෙළෙඳ සහ වෙනත් ලැබීම්

**05.1** අත්තිකාරම්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **107-1** | වේතන අත්තිකාරම් - 4040 | 11,289,373.69 | 12,060,489.61 |
| **107-2** | උත්සව අත්තිකාරම් - 5012 | 148,889,550.55 | 202,263,198.00 |
| **107-3** | ක්‍රීඩා අත්තිකාරම් - 5012/1 | 25,557,075.37 | 23,544,586.00 |
| **107-4** | විශේෂ ණය අත්තිකාරම් - 5012/2 | 33,861,646.48 | 46,037,504.95 |
| **107-5** | වෙනත් අත්තිකාරම් | 14,867,970.98 | 12,062,620.27 |
| **107-6** | ස්ථානීය මිලදී ගැනීම් අත්තිකාරම් | 1,494,298,735.42 | 1,496,150,077.34 |
| **107-7** | ශ්‍රී ලංගම අත්තිකාරම් ගිණුම | 2,797,767.50 | 2,797,767.50 |
| **107-8** | විශේෂ අත්තිකාරම් ගිණුම - 4040/1 | 863,306.52 | 730,006.52 |
| | එකතුව | **1,732,425,426.51** | **1,795,646,250.19** |

**05.2** වෙනත් ලැබිය යුතු ගිණුම්

| | | | |
|---|---|---|---|
| **108-1** | විවිධ ණය ගැතියෝ ගිණුම | 109,596,829.49 | 108,069,141.30 |
| **108-2** | වෙළෙඳ ණය ගැතියෝ ගිණුම | 15,386,338.22 | 15,009,528.71 |
| **108-3** | ලැබිය යුතු ආදායම් ගිණුම | 93,923,144.26 | 117,760,823.07 |
| **108-4** | යුධ හමුදා - ලැබිය යුතු කුලී ගිණුම | 69,419,277.10 | 191,892,366.34 |
| **108-5** | පොලිස් ගමන් බලපත්‍ර ලැබිය යුතු ගාස්තු ගිණුම | 589,929,148.10 | 389,975,838.49 |
| **108-6** | උසාවි ඇප තැන්පත් ගිණුම | 6,580,898.70 | 7,969,070.79 |
| **108-7** | වෙනත් තැන්පතු ගිණුම | 4,668,429.15 | 5,946,928.68 |
| **108-8** | කොන්දොස්තර හිඟ මුදල | 6,141,909.29 | 6,987,068.73 |
| **108-9** | Donations - Tsunami | 136,800.00 | - |
| **108-10** | විශ්වාස ඇප අරමුදල් ගිණුම | 70,331.76 | 70,331.76 |
| **108-11** | ඉන්ධන විකුණුම් පාලන ගිණුම | 2,906,096.83 | 2,124,898.15 |
| **108-12** | ලක්දිව ඉංජිනියරින් - ඒකල | 10,549.50 | 10,549.50 |
| **108-13** | මුදල් අයකැමි හිඟය ගිණුම | 427,709.55 | 3,815,947.99 |
| **108-14** | ඉදිරියට ගෙවූ වියදම් ගිණුම | 269,288,760.29 | 269,234,578.15 |
| **108-18** | බාහිර පාර්ශවයන් සඳහා කරන ලද කාර්යයන් | 2,931,618.84 | 705,245.53 |
| **108-20** | තැන්පතු - බහාලුම් තැන්පතු | - | 18,250.00 |
| **108-23** | බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන්කිරීම් ගිණුම | (39,713,199.88) | (39,713,199.88) |
| | එකතුව | **1,131,704,641.20** | **1,079,877,367.31** |
| | මුළු එකතුව | **2,864,130,067.71** | **2,875,523,617.50** |

**6** **වෙනත් මූල්‍ය වත්කම්**

| | | | |
|---|---|---|---|
| **105-1** | භාණ්ඩාගාර බිල්පත් ගිණුම | 8,223,252.10 | 7,749,998.26 |
| **105-2** | වෙනත් | - | - |
| **105-2-B** | විශ්වාස ඇප ආයෝජන ගිණුම | 42,678.00 | 42,678.00 |
| **105-2-C** | සේවක ආරක්ෂක ඇප ආයෝජන ගිණුම | 516,555.17 | 587,831.01 |
| **105-2-D** | ස්ථාවර තැන්පතු ගිණුම | 1,122,581,488.79 | 1,063,521,198.79 |
| **105-2-F** | වෙනත් ආයෝජන ගිණුම | - | - |
| | එකතුව | **1,131,363,974.06** | **1,071,901,706.06** |

**7** මුදල් හා මුදල් වලට සමාන දෑ

| | | | |
|---|---|---|---|
| **105-2-A** | කෙටි කාලීන ආයෝජන | 650,000,000.00 | 585,000,000.00 |
| **105-2-E** | ඉතිරි කිරීමේ ගිණුම් | 1,311,937,499.35 | 1,856,494,264.45 |
| | එකතුව | **1,961,937,499.35** | **2,441,494,264.45** |

**07.** බැංකුවේ ඇති මුදල්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **109-1** | ප්‍රධාන කාර්යාලය | 172,999,041.59 | 186,091,977.35 |
| | ප්‍රාදේශීය කාර්යාලය හා ඩිපෝ | 327,086,738.06 | 520,322,816.40 |
| | ප්‍රාදේශීය වැඩපල, රියදුරු අභ්‍යාස විද්‍යාල හා ඉන්ධන | 165,571,952.26 | 180,893,157.00 |
| | එකතුව | **665,657,731.91** | **887,307,950.75** |

**07.**බැංකු අයිරාව

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| 109-1 | ප්‍රධාන කාර්යාලය | 11,008,177.21 | 98,243,667.04 |
| | ප්‍රාදේශීය කාර්යාලය හා ඩිපෝ | 136,726,688.96 | 141,199,888.30 |
| | ප්‍රාදේශීය වැඩපල, රියදුරු අභ්‍යාස විද්‍යාල හා ඉන්ධන | 31,890.00 | - |
| | එකතුව | **147,766,756.17** | **239,443,555.34** |

**07.** අතැති මුදල්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **110-1** | අතැති මුදල් ගිණුම | 7,982,732.35 | 7,489,661.60 |
| **110-2** | සුළු මුදල් අග්‍රිමය ගිණුම | 593,254.99 | 633,609.49 |
| **110-3** | මාර්ගස්ථ මුදල් ගිණුම | 51,885,936.71 | 90,387,563.88 |
| **110-4** | මුද්දර අග්‍රිමය ගිණුම | 199,485.00 | 149,604.00 |
| **110-5** | නිල වාහන අග්‍රිමය | 245,939.00 | 190,886.00 |
| **110-6** | ආදායම් අවිනිශ්චිත ගිණුම | 53,727,377.83 | 94,787,218.61 |
| | එකතුව | **114,634,725.88** | **193,638,543.58** |

| | | |
|---|---|---|
| **07.**මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන් එකතුව | **2,742,229,957.14** | **3,522,440,758.78** |
| **07.** බැංකු අයිරාව එකතුව | **147,766,756.17** | **239,443,555.34** |

**08.** සමුච්චිත අලාභය

| | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | <u>සමුච්චිත අලාභය</u> | රු. | රු. |
| **201** | පෙර වර්ෂයේ සමුච්චිත අලාභය | (42,011,553,749.77) | (43,509,944,006.02) |
| **201-1** | එකතු කළා - පෙර වර්ෂයේ ලාභාලාභ ගැලපුම් ගිණුම | (19,339,478.07) | 1,023,658,666.63 |
| | වර්ෂය සඳහා ලාභය හෝ අලාභය | (2,104,994,394.94) | 474,731,589.62 |
| | **එකතුව** | **(44,135,887,622.78)** | **(42,011,553,749.77)** |

**භාණ්ඩාගාර කොටස් ප්‍රග්ධනය**

| | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **202-5** | කොටස් ප්‍රග්ධනය | 3,368,242,400.00 | 3,368,242,400.00 |
| **202-6** | කොටස් ප්‍රග්ධනය - භාණ්ඩාගාර ගිණුම | 576,648,150.00 | 576,648,150.00 |
| | | **3,944,890,550.00** | **3,944,890,550.00** |

**09.** රජයේ ප්‍රතිදාන

| | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **202-3** | 01.01.2020 දිනට ශේෂය | 2,981,392,312.95 | 2,981,392,312.95 |
| | 2020 වර්ෂය සඳහා භාණ්ඩාගාර ලැබීම් | 354,628,007.59 | (0.00) |
| | වර්ෂය සඳහා වෙන්කිරීම් | (35,462,800.76) | - |
| | 31.12.2020 දිනට ශේෂය | **3,300,557,519.78** | **2,981,392,312.95** |

**10.** සංචිත

| | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **201-2** | ප්‍රාග්ධන සංචිත ගිණුම | 22,295,374.57 | 22,295,374.57 |
| **201-3** | රක්‍ෂණ සංචිත ගිණුම | 292,329.36 | 292,329.36 |
| **201-4** | කම්කරු වන්දි අරමුදල් ගිණුම | 2,988,322.52 | 2,988,322.52 |
| **201-5** | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ගිණුම | 2,667,679.00 | 2,667,679.00 |
| **201-6** | වාර ප්‍රවේශපත්‍ර අරමුදල් ගිණුම | 272,673.18 | 272,673.18 |
| **201-7** | අබලි ද්‍රව්‍ය සඳහා වෙන්කිරීම් | - | - |
| **201-8** | වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම | 140,397,051.58 | 140,397,051.58 |
| **201-9** | ප්‍රාග්ධන සංචිත හා වෙනත් සංචිත | 5,301,844,511.56 | 5,301,844,511.56 |
| **201-10** | ලියා හරින ලද අලාභ සංචිත | - | - |
| | | **5,470,757,941.77** | **5,470,757,941.77** |

**11.** විශ්‍රාමික පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| **202-1** | වර්ෂය ආරම්භක ශේෂය | 13,593,105,638.09 | 13,576,902,113.41 |
| | ප්‍රවර්තන වර්ෂය සඳහා වෙන් කිරීම් | 831,270,451.17 | 1,276,157,462.95 |
| | වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (973,788,529.55) | (1,259,953,938.27) |
| | වර්ෂය අවසාන ශේෂය | **13,450,587,559.71** | **13,593,105,638.09** |
| | | | |

**12.** වෙනත් ජංගම නොවන වගකීම්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| **202-20** | ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම | 2,196,236,339.00 | 2,993,120,339.00 |
| **202-21** | දිගු කාලීන වගකීම් - ශ්‍රී ලංගම අර්ථ සාධක අරමුදල | 1,860,824,837.37 | 1,860,824,837.37 |
| **202-24** | ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම් | 400,000,000.00 | 400,000,000.00 |
| **202-2** | පොලී අවිනිශ්චිත ගිණුම | (596,606,272.35) | (842,664,282.15) |
| | එකතුව | **3,860,454,904.02** | **4,411,280,894.22** |

**13.** අක්‍රිය ගිණුම

| | | 31.12.2020<br>Rs. | 31.12.2019<br>Rs. |
|---|---|---|---|
| **203-2-12** | අක්‍රිය ගිණුම් -බැර ශේෂ | 18,526,264,783.02 | 18,526,264,783.02 |
| | | **18,526,264,783.02** | **18,526,264,783.02** |

**14.** වෙළඳ හා වෙනත් ගෙවීම්

**14.1** ණය හිමියෝ

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| **203-1-1** | වෙළෙඳ ණය හිමියෝ ගිණුම | 2,655,641,299.18 | 2,810,347,686.02 |
| **203-1-2** | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා ගිණුම | 41,491,285.21 | 58,205,876.40 |
| **203-1-3** | වෙනත් ණය හිමියෝ ගිණුම | 117,913,617.16 | 116,685,736.81 |
| **203-1-4** | ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථා ගිණුම | 331,367.61 | 384,400.95 |
| **203-1-5** | අවලංගු චෙක් පත් | - | 594,637.40 |
| **203-1-6** | නොගෙවූ වේතන අඩුකිරීම් ගිණුම | 13,958,374.45 | 14,766,881.15 |
| **203-1-7** | සුනාමි අරමුදල ගිණුම | 748,340.33 | 748,340.33 |
| **203-1-8** | ගෙවිය යුතු තෙවන පාර්ශවීය ගෙවීම් ගිණුම | 42,501,712.16 | 48,239,142.57 |
| **203-1-9** | 7070 සේ.අ.අ. ණය ගිණුම | 27,249,139.30 | 27,249,139.30 |
| **203-1-10** | 7082 සේ.අ.අ. රූපවාහිනී ණය ගිණුම | 9,289,899.14 | 9,289,899.14 |
| **203-1-11** | 7075 සේ.අ.අ. නිවාස ණය ගිණුම | 210,935,869.67 | 211,051,336.79 |
| **203-1-12** | 7078 සේ.අ.අ. ණය ගිණුම | 576,741.11 | 576,741.11 |
| **203-1-13** | දඩ අරමුදල ගිණුම | 48,823,254.66 | 44,377,418.54 |
| **203-1-14** | ක්‍රීඩා පාලක සභා ගිණුම | 13,287,554.80 | 11,664,530.30 |
| **203-1-15** | වෘත්තීය සමිති ගිණුම | 35,429,441.78 | 30,567,815.43 |
| **203-1-16** | අවමංගල්‍යාධාර සමිති ගිණුම | 56,743,950.46 | 47,054,322.55 |
| **203-1-17** | සුභසාධක සංගමය ගිණුම | 57,669,920.57 | 47,167,507.41 |
| **203-1-18** | ආපනශාලා අයකිරීම් ගිණුම | 6,063,969.96 | 5,710,319.35 |
| **203-1-19** | බැංකු ණය ගිණුම- (වේතනයෙන් අයවිය යුතු) | 56,837,914.37 | 66,225,966.19 |
| **203-1-19** | බැංකු ණය ගිණුම | 12,050,383.56 | 12,050,383.56 |
| **203-1-20** | ගෙවිය යුතු රක්‍ෂණ ගිණුම | 1,023,445.12 | 1,027,319.87 |
| **203-1-21** | මුද්දර ගාස්තු අයකිරීම් ගිණුම | 28,326,808.81 | 24,740,586.04 |
| **203-1-22** | දඩ අයකිරීම් ගිණුම | 581,275,796.02 | 569,537,427.84 |
| **203-1-23** | දඩ අරමුදලට අයකිරීම් ගිණුම | 85,869,239.57 | 95,217,164.79 |
| **203-1-24** | නොගෙවූ වේතනයෙන් අඩුකිරීම් | 6,264,941.53 | 7,738,050.83 |
| **203-1-25** | ටෙන්ඩර් තැන්පතු ගිණුම | 11,840,356.99 | 15,527,160.99 |
| **203-1-26** | වෙනත් තැන්පතු ගිණුම | 9,549,670.90 | 12,795,994.99 |
| **203-1-27** | අවිනිශ්චිත ගිණුම | (183,428.09) | 967,187.91 |
| **203-1-28** | තැන්පතු - බාහිර පාර්ශව ගිණුම | 3,057,310.40 | 3,061,285.40 |
| **203-1-29** | තැන්පතු - ටෙන්ඩර් (කර්මාන්ත ශාලා) ගිණුම | 10,909,905.28 | 10,909,805.28 |
| **203-1-30** | සේවක තැන්පතු ගිණුම | 158,941,686.40 | 157,615,006.41 |
| **203-1-31** | ගෙවිය යුතු විවිධ ගිණුම | 12,958,451.74 | 12,925,488.93 |

| | | | |
|---|---|---|---|
| **203-1-32** | අර්ථසාධක අරමුදල් අධිහාර ගිණුම | 5,109,973.46 | 5,109,973.46 |
| **203-1-33** | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් අධිහාර ගිණුම | 3,803,993.06 | 3,989,076.26 |
| **203-1-35** | ගෙවිය යුතු කුලී ගාස්තු ගිණුම | 4,359,594.63 | 4,387,919.25 |
| **203-1-38** | විශ්වාස බැදුම්කර | 54,049.46 | 54,049.46 |
| **203-1-46** | අවිනිශ්චිත පොළී ගිණුම ( බස් 272 හා 53 ) | (211,700,389.80) | (179,402,723.00) |
| **203-1-47** | ණයහිමි ගිණුම ලංකා අශෝක් ලේලන්ඩ් ( බස් 272 හා 53 ) | 685,884,000.00 | 574,884,000.00 |
| **203-1-45** | කර්මාන්තශාලා අයකිරීම් ගිණුම | 18,310.00 | - |
| **203-1-48** | කොන්ත්‍රාත් තැන්පතු ගිණුම(කර්මාන්තශාලා) | 2,832,243.12 | - |
| **203-1-49** | තැන්පතු | 3,249,819.80 | 4,638,643.97 |
| **203-1-50** | ටෙන්ඩර් තැන්පතු ගිණුම | 2,093,000.00 | 2,293,000.00 |
| **203-1-54** | කල්බදු ණයහිමි - මහජන බැංකුව | - | 95,091,273.20 |
| **203-1-56** | වේරහැර ඉඩම වෙනුවෙන් ලද මුදල | 4,554,000,000.00 | 4,054,000,000.00 |
| **203-1-57** | ලංකා අශෝක් ලේලන්ඩ් ණය ගිණුම | 108,961,684.90 | 109,971,684.90 |
| **203-1-59** | හඳුනානොගත් ලැබීම් | 1,800.00 | |
| | එකතුව | **9,476,046,298.78** | **9,150,037,458.08** |

**203-1-56** **වේරහැර ඉඩම වෙනුවෙන් ලද මුදල**

**ඉහත සඳහන් කළ රු.මි.4554 නියෝජනය කරන්නේ වේරහැර ඉඩම ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට පැවරීම සම්බන්ධව මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල වේ.**

**14.2** **උපචිත වියදම්**

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **203-3-1** | ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම | 4,079,852.73 | 4,079,852.73 |
| **203-3-2** | දේශීය මිලදී ගැණුම් අවිනිශ්චිත ගිණුම | - | - |
| **203-3-3** | සේ.අ.අ. ගෙවිය යුතු ගිණුම (ශ්‍රී ලංගම) | 287,358,936.27 | 287,366,829.84 |
| **203-3-4** | සේ.අ.අ. ගෙවිය යුතු ගිණුම (මහ බැංකුව) | 341,717,534.18 | 310,487,994.12 |
| **203-3-5** | සේ.භා.අ. ගෙවිය යුතු ගිණුම (මහ බැංකුව) | 34,224,642.80 | 27,244,993.49 |
| **203-3-6** | වේතන පාලන ගිණුම | 902,906,804.76 | 1,049,171,167.67 |
| **203-3-7** | උපචිත වියදම් ගිණුම | 478,887,766.40 | 896,976,601.72 |
| **203-3-7** | උපචිත වියදම් ගිණුම - කල්බදු ණයහිමි | - | - |
| **203-3-7** | උපචිත වියදම් ගිණුම - සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ වන්දි | - | - |
| **203-3-8** | මාර්ගගත ක්‍රමය යටතේ බස් ටිකට් වෙන්කිරීමේ පාලන ගිණුම | (1,140,751.00) | (8,433.00) |
| | එකතුව | **2,048,034,786.14** | **2,575,319,006.57** |

**15.** ආදායම්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **301-1** | මාර්ග ලේඛන ආදායම | 16,787,385,167.05 | 27,441,637,726.12 |
| **301-2** | වාර ප්‍රවේශ පත්‍ර | 591,605,217.28 | 1,141,701,778.16 |
| **301-3** | විශේෂ වාරිකා | 599,728,094.58 | 453,053,440.32 |
| **301-4** | තැපැල් ප්‍රවාහන | 45,628,032.95 | 67,833,501.66 |
| **301-5** | හමුදා ගමන් අවසරපත්‍ර | 142,858,305.68 | 155,763,442.06 |
| **301-6** | පොලිස් ගමන් බලපත්‍ර | 509,323,606.42 | 553,960,907.39 |
| **301-7** | හමුදා විශේෂ වාරිකා | 5,765,553.00 | 7,011,912.00 |
| **301-8** | පුවත්පත් ප්‍රවාහනය | 297,600.00 | 791,766.00 |
| **301-9** | ගමන් බලපත්‍ර ආදායම් | 169,070,650.78 | 187,992,354.51 |
| **301-10** | භාණ්ඩ ප්‍රවාහන ආදායම | 22,917,775.25 | 36,641,657.90 |
| **301-11** | සුභසාධන වාරිකා | 2,092,590.00 | 1,656,954.00 |
| **301-12** | පොලිස් වවුචර්පත් | 7,811,572.00 | 306,762.00 |
| **302-1-1** | ගැමි සැරිය | - | - |
| **302-1-2** | සිසු සැරිය | 116,776,235.00 | 225,364,794.93 |
| **302-1-3** | නිසි සැරිය | 11,081,359.00 | 13,377,501.00 |
| **302-4-D** | වාර ප්‍රවේශපත්‍ර ප්‍රතිපාදන | 5,550,000,000.00 | 5,450,000,000.50 |
| | එකතුව | **24,562,341,758.99** | **35,737,094,498.55** |

**16.** ආයතන හා පරිපාලන වියදම්

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020 රු. | 31.12.2019 රු. |
|---|---|---|---|
| **401-1** | බස් රථ ධාවන වියදම් | 13,912,385,620.33 | 16,036,742,629.14 |
| **401-2** | සෘජු ඉන්ධන හා ලිහිසි | 9,535,272,494.36 | 13,879,046,691.91 |
| **401-3** | වෙනත් සෘජු වියදම් | 3,084,792,889.47 | 4,747,652,592.86 |
| **402-3-1** | ක්ෂය - බස්රථ | 2,143,299,030.80 | 1,929,355,607.93 |
| | එකතුව | **28,675,750,034.96** | **36,592,797,521.84** |

| | බස් රථ ධාවන වියදම් | රු. 31.12.2020 | රු. 31.12.2019 |
|---|---|---|---|
| 401-1-1 | වේතන - රියදුරු හා කොන්දොස්තර | 4,905,159,681.95 | 5,113,816,869.34 |
| 401-1-14 | වේතන - ඉංජිනේරු කණ්ඩායම් | 1,402,539,365.51 | 1,483,853,028.75 |
| 401-1-3 | අතිකාල - ලේඛනගත රියදුරු හා කොන්දොස්තර | 1,393,492,256.22 | 2,147,921,245.75 |
| 401-1-4 | අතිකාල - ලේඛනගත නොවන රියදුරු හා කොන්දොස්තර | 224,536,619.13 | 384,312,376.29 |
| 401-1-16 | අතිකාල - ඉංජිනේරු | 232,655,703.95 | 381,786,500.55 |
| 401-1-6 | ගමන් වියදම් - රියදුරු/කොන්දොස්තර | 4,195,532.25 | 8,542,078.15 |
| 401-1-18 | ගමන් වියදම් - ඉංජිනේරු | 2,699,427.20 | 4,052,459.48 |
| 401-1-2 | ජීවනාංක දීමනාව - රියදුරු/කොන්දොස්තර | 1,609,916,074.75 | 1,647,548,126.50 |
| 401-1-15 | ජීවනාංක දීමනාව - ඉංජිනේරු | 411,853,669.92 | 424,374,190.39 |
| 401-1-5 | බස් සේවක - අන්තර්කාල | 22,219,237.80 | 35,986,977.81 |
| 401-1-7 | දිරිදීමනා - රියදුරු/ කොන්දොස්තර | 580,494,496.59 | 1,067,097,424.56 |
| 401-1-17 | දිරිදීමනා - ඉංජිනේරු | 114,165,024.84 | 201,529,430.09 |
| 401-1-8 | පැමිණීමේ දීමනා - රියදුරු/කොන්දොස්තර | 3,523,620.07 | 7,799,313.42 |
| 401-1-19 | පැමිණීමේ දීමනා - ඉංජිනේරු | 654,218.16 | 1,959,711.00 |
| 401-1-10 | විශේෂ දීමනා - රියදුරු/කොන්දොස්තර | 1,268,759,646.93 | 1,312,665,298.54 |
| 401-1-20 | විශේෂ දීමනා - ඉංජිනේරු | 313,051,159.30 | 329,232,104.16 |
| 401-1-23 | බස් පිරිසිදු කිරීමේ හා බලාගැනීමේ දීමනා | 39,191,626.80 | 33,984,536.05 |
| 401-1-9 | රාත්‍රි නවාතැන් දීමනා - රියදුරු/කොන්දොස්තර | 6,814,207.77 | 12,884,172.85 |
| 401-1-11 | මාර්ග ලේඛන පරීක්ෂා කිරීමේ කොමිස් | 4,069,973.15 | 4,357,554.03 |
| 401-1-12 | සේ.අ.අ. - රියදුරු හා කොන්දොස්තර | 810,470,975.71 | 848,774,788.88 |
| 401-1-21 | සේ.අ.අ. - ඉංජිනේරු | 250,186,042.42 | 260,972,358.11 |
| 401-1-13 | සේ.භා.අ. - රියදුරු හා කොන්දොස්තර | 195,157,825.87 | 209,869,329.13 |
| 401-1-22 | සේ.භා.අ. - ඉංජිනේරු | 65,103,071.84 | 66,783,467.70 |
| 401-1-24 | වෙනත් විචල්‍ය වියදම් | 51,476,162.20 | 46,639,287.61 |
| | | **13,912,385,620.33** | **16,036,742,629.14** |

| | සෘජු ඉන්ධන හා ලිහිසි | | |
|---|---|---|---|
| 401-2-A | බස් රථ සඳහා තෙල් හා ලිහිසි (සෘජු පිරිවැය) | 221,875,192.39 | 337,176,367.74 |
| 401-2-B | බස් රථ සඳහා ඉන්ධන (සෘජු පිරිවැය) | 9,313,397,301.97 | 13,541,870,324.17 |
| | | **9,535,272,494.36** | **13,879,046,691.91** |

| | වෙනත් සෘජු විචල්‍ය පිරිවැය | | |
|---|---|---|---|
| 401-3-1 | අමතර කොටස් | 1,344,648,716.73 | 1,798,617,969.35 |
| 401-3-2 | නව ටයර් හා ටියුබ් | 615,712,627.69 | 1,050,125,839.47 |
| 401-3-3 | නැවත පිරවූ ටයර් | 707,324,095.78 | 1,221,709,579.64 |
| 401-3-4 | බස් රථ සඳහා බැටරි | 102,500,330.30 | 131,693,023.65 |
| 401-3-5 | බස් රථ අළුත්වැඩියා හා නඩත්තු වියදම් | 264,408,980.70 | 437,172,416.05 |
| 401-3-6 | බස් රථ - රක්ෂණ වියදම් | 11,846,098.41 | 13,340,120.36 |
| 401-3-7 | බස් රථ - ලියාපදිංචි ගාස්තු සහ ආදායම් බලපත්‍ර | 5,255,941.84 | 22,552,177.73 |
| 401-3-8 | ටිකට් හා මාර්ග ලේඛන වියදම් | 33,096,098.02 | 72,441,466.61 |
| | | **3,084,792,889.47** | **4,747,652,592.86** |

**17.** වෙනත් ආදායම

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| **303-1** | කුලී ආදායම | 24,798,922.27 | 18,639,560.29 |
| **303-2** | රියදුරු අභ්‍යාස විද්‍යාල | (3,850,677.15) | (17,745,655.30) |
| **303-3** | ඉන්ධන පිරවුම්හල් ආදායම | (3,198,710.13) | (1,647,756.21) |
| **303-4** | සංචාරක බංගලා | 4,727,577.44 | 9,048,850.00 |
| **303-5** | ප්‍රචාරණය | 2,851,885.45 | 5,557,310.00 |
| **303-6** | දඩ අයකිරීම් | 896,240.46 | 2,921,719.48 |
| **303-8** | ලාභාංශ ලැබීම් | 156,250.00 | - |
| **303-9** | දැවි තෙල් විකුණුම් | 10,079,423.58 | 10,079,649.15 |
| **303-10** | මුදල් අධිකය | 654,927.05 | 730,982.72 |
| **303-11** | අලාභ අයකර ගැනීම් | 11,986,655.04 | 19,304,794.97 |
| **303-12** | දේපලවලින් ලද ආදායම | 32,518,721.50 | 2,616,883.31 |
| **303-13** | ගොඩනැගිලි හා ආපන ශාලා කුලී | 6,398,805.19 | 5,126,723.67 |
| **303-14** | කොමිස් හා වට්ටම් | 30,043,136.55 | 35,812,571.74 |
| **303-15** | යෝග්‍යතා සහතික | 9,280,627.50 | 8,829,365.45 |
| **303-16** | බාහිර පාර්ශවයන්ගේ අළුත්වැඩියාවලින් ලැබූ ආදායම | 500,732.92 | 683,507.10 |
| **303-17** | දොඹකර ගාස්තු | 1,137,692.74 | 492,915.00 |
| **303-18** | රක්ෂණ කොමිස් | 27,728.75 | 296,154.65 |
| **303-19** | අයකැමි අධිකය | 161,985.02 | 185,080.81 |
| **303-20** | හැඳුනුම්පත් ආදායම | 1,114,394.00 | 1,735,308.60 |
| **303-21** | තොග ගැලපුම් ගිණුම | 2,044,092.80 | (5,568,101.22) |
| **303-22** | ඉන්ධන තොගයේ අතිරික්තය/ හිඟය | 6,459,777.31 | 11,159,624.43 |
| **303-23** | අබලි ද්‍රව්‍ය විකුණුම් | 26,490,885.43 | 33,160,389.17 |
| **303-24** | වෙනත් ආදායම් | 127,408,824.28 | 231,585,885.57 |
| **303-25** | ශාලිකා ආදායම් | 564,900.00 | 4,488,320.00 |
| **303-26** | ඉන්ධන ආදායම් | 26,209,046.10 | 25,628,041.07 |
| **303-27** | බස්රථ විකුණුම් ලාභය | - | 41,673,000.00 |
| **303-29** | වෙනත් අයතම විකුණුම් | 2,707,741.52 | 3,409,800.25 |
| **303-30** | අබලි ද්‍රව්‍ය අතිරික්තය | 147,871.15 | - |
| **302-1-A** | අනාර්ථික මාර්ග ප්‍රතිපාදන | 5,850,000,000.00 | 5,500,000,000.00 |
| **302-1-4** | වෙනත් ප්‍රතිපාදන | 210,000,270.00 | 999,618,807.33 |
| | එකතුව | **6,382,319,726.77** | **6,947,823,732.03** |

**18.** ආයතන හා පරිපාලන වියදම්

| ගිණුම් සංකේත | විස්තරය | | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|---|
| | වැටුප් හා වේතන | 18.1 | 1,085,705,521.65 | 1,193,271,555.76 |
| | අතිකාල හා නිවාඩු දීමනා | 18.2 | 193,172,869.03 | 287,456,465.40 |
| | ජීවනාංක දීමනාව | 18.3 | 462,132,329.49 | 502,837,182.16 |
| | ගමන් වියදම් දීමනා | 18.4 | 11,610,943.93 | 19,999,283.44 |
| | වෙනත් විශේෂ දීමනා | 18.5 | 745,222,031.54 | 844,428,707.40 |
| | අළුත්වැඩියා හා නඩත්තු | 18.6 | 172,059,788.66 | 205,268,414.07 |
| **402-1-6** | සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | | 329,500.00 | 567,000.00 |
| **402-1-8** | පෞද්ගලික ආරක්ෂක වේතන | | 80,475,224.90 | 104,400,116.93 |
| **402-1-9** | වෛද්‍ය බිල්පත් | | 868,196.99 | 790,479.50 |
| **402-1-10** | වෙනත් දීමනා | | 5,901,392.91 | 14,734,932.33 |
| **402-1-11** | කොන්ත්‍රාත් හා දෛනික සේවක දීමනා | | 112,110,774.89 | 114,085,958.02 |
| **402-1-12** | සේවක අර්ථසාධක අරමුදල් | | 330,146,221.17 | 312,240,558.06 |
| **402-1-13** | සේවක භාරකාර අරමුදල් | | 86,260,200.09 | 69,665,537.31 |
| **402-2-5** | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | 85,921,925.56 | 136,036,210.91 |
| **402-2-6** | කුලී හා නඩත්තු | | 39,846,434.75 | 56,843,229.98 |
| **402-2-7** | දුරකතන | | 45,164,396.83 | 49,661,589.87 |
| **402-2-8** | විදුලිය | | 87,685,399.43 | 106,484,983.37 |
| **402-2-9** | ජලය | | 26,618,872.83 | 31,123,302.92 |
| **402-2-10** | වාර්ෂික ප්‍රසාද දීමනා | | 291,894,499.32 | 285,913,567.64 |
| **402-2-11** | පාරිතෝෂික දීමනා | | 831,270,451.17 | 1,276,157,462.95 |
| **402-2-12** | වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීම | | 4,455,272.80 | 7,785,022.74 |
| **402-2-13** | නීති වියදම් | | 16,717,001.48 | 33,964,692.28 |
| **402-2-14** | සුභසාධන වියදම් | | 28,559,194.23 | 22,392,370.60 |
| **402-2-15** | කරුණාසහගත දීමනා | | 15,960,123.25 | 13,816,504.08 |
| **402-2-16** | සේවක වන්දි | | 3,415,031.00 | 4,213,909.11 |
| **402-2-17** | පොලිස් ආරක්ෂක වියදම් | | 2,544,405.40 | 3,935,858.75 |
| **402-2-19** | ඉන්ධන තෙල් හා ලිහිසි (වක්‍ර වියදම්) | | 20,033,014.65 | 20,874,732.07 |
| **402-2-20** | සංග්‍රහ වියදම් | | 9,062,598.56 | 10,018,169.82 |
| **402-2-21** | වෙනත් වියදම් | | 187,069,685.40 | 859,492,293.05 |
| **402-2-23** | ප්‍රචාරණ වියදම | | 2,060,773.18 | 5,024,160.15 |
| **402-2-24** | වෙනත් වාහන සඳහා රක්ෂණ | | 7,294,803.53 | 11,375,304.88 |
| **402-3-2** | ක්ෂය | 18.7 | 364,096,368.30 | 336,136,670.85 |
| | එකතුව | | **5,355,665,246.92** | **6,940,996,226.40** |

| ***18.1*** | <u>වැටුප් හා වේතන</u> | **31.12.2020** | **31.12.2019** |
|---|---|---|---|
| **402-1-1-A** | වැටුප් හා වේතන - ධාවන කාර්යය මණ්ඩල | 431,639,898.99 | 473,698,194.00 |
| **402-1-1-B** | වැටුප් හා වේතන - ගිණුම් කාර්යය මණ්ඩල | 151,008,179.66 | 160,309,163.21 |
| **402-1-1-C** | වැටුප් හා වේතන - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 186,214,681.33 | 202,186,641.66 |
| **402-1-1-D** | වැටුප් හා වේතන - ගිණුම් පරීක්ෂක කාර්යය මණ්ඩල | 20,230,256.84 | 20,520,555.24 |
| **402-1-1-E** | වැටුප් හා වේතන - විනය කාර්යය මණ්ඩල | 25,547,954.22 | 24,045,922.94 |
| **402-1-1-F** | වැටුප් හා වේතන - ආරක්ෂක කාර්යය මණ්ඩල | 196,478,043.27 | 229,181,059.90 |
| **402-1-1-G** | වැටුප් හා වේතන - සම්පාදක කාර්යය මණ්ඩල | 67,936,506.76 | 75,166,177.04 |
| **402-1-1-H** | වැටුප් හා වේතන - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල | 6,635,000.58 | 8,163,841.77 |
| **402-1-7** | වැටුප් හා වේතන - උපාධිධාරී පුහුණු | 15,000.00 | - |
| | | **1,085,705,521.65** | **1,193,271,555.76** |

| ***18.2*** | <u>අතිකාල හා නිවාඩු දීමනා</u> | | |
|---|---|---|---|
| **402-1-2-A** | අතිකාල හා නිවාඩු දීමනා - ධාවන කාර්යය මණ්ඩල | 54,190,877.54 | 106,075,094.44 |
| **402-1-2-B** | අතිකාල හා නිවාඩු දීමනා - ගිණුම් කාර්යය මණ්ඩල | 3,735,448.82 | 8,493,605.98 |
| **402-1-2-C** | අතිකාල හා නිවාඩු දීමනා - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 15,302,964.96 | 28,368,008.73 |
| **402-1-2-D** | අතිකාල හා නිවාඩු දීමනා - ගිණුම් පරීක්ෂක කාර්යය මණ්ඩ | 43,027.54 | 995,376.39 |
| **402-1-2-E** | අතිකාල හා නිවාඩු දීමනා - විනය කාර්යය මණ්ඩල | 3,046,903.53 | 4,886,548.18 |
| **402-1-2-F** | අතිකාල හා නිවාඩු දීමනා - ආරක්ෂක කාර්යය මණ්ඩල | 111,816,569.15 | 126,557,024.68 |
| **402-1-2-G** | අතිකාල හා නිවාඩු දීමනා - සම්පාදක කාර්යය මණ්ඩල | 4,855,576.09 | 11,313,896.57 |
| **402-1-2-H** | අතිකාල හා නිවාඩු දීමනා - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය | 181,501.40 | 766,910.43 |
| | | **193,172,869.03** | **287,456,465.40** |

| ***18.3*** | <u>ජීවනාංක දීමනාව</u> | | |
|---|---|---|---|
| **402-1-3-A** | ජීවනාංක දීමනාව - ධාවන කාර්යය මණ්ඩල | 208,571,537.06 | 225,564,834.16 |
| **402-1-3-B** | ජීවනාංක දීමනාව - ගිණුම් කාර්යය මණ්ඩල | 71,427,686.01 | 73,581,086.25 |
| **402-1-3-C** | ජීවනාංක දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 73,508,627.52 | 80,187,096.76 |
| **402-1-3-D** | ජීවනාංක දීමනාව - ගිණුම් පරීක්ෂක කාර්යය මණ්ඩල | 9,150,690.00 | 9,653,550.00 |
| **402-1-3-E** | ජීවනාංක දීමනාව - විනය කාර්යය මණ්ඩල | 10,462,212.67 | 10,803,648.74 |
| **402-1-3-F** | ජීවනාංක දීමනාව - ආරක්ෂක කාර්යය මණ්ඩල | 58,606,646.49 | 64,377,499.01 |
| **402-1-3-G** | ජීවනාංක දීමනාව - සම්පාදක කාර්යය මණ්ඩල | 28,685,918.63 | 36,666,417.05 |
| **402-1-3-H** | ජීවනාංක දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල | 1,719,011.11 | 2,003,050.19 |
| | | **462,132,329.49** | **502,837,182.16** |

| ***18.4*** | <u>ගමන් වියදම් දීමනා</u> | | |
|---|---|---|---|
| **402-1-4-A** | ගමන් වියදම් දීමනාව - ධාවන කාර්යය මණ්ඩල | 6,300,944.74 | 11,360,139.10 |
| **402-1-4-B** | ගමන් වියදම් දීමනාව - ගිණුම් කාර්යය මණ්ඩල | 1,042,739.25 | 1,470,751.66 |
| **402-1-4-C** | ගමන් වියදම් දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 1,600,792.19 | 2,611,723.00 |
| **402-1-4-D** | ගමන් වියදම් දීමනාව - ගිණුම් පරීක්ෂක කාර්යය මණ්ඩල | 922,778.50 | 1,672,183.00 |
| **402-1-4-E** | ගමන් වියදම් දීමනාව - විනය කාර්යය මණ්ඩල | 558,522.50 | 728,462.50 |
| **402-1-4-F** | ගමන් වියදම් දීමනාව - ආරක්ෂක කාර්යය මණ්ඩල | 631,819.50 | 1,104,580.38 |
| **402-1-4-G** | ගමන් වියදම් දීමනාව - සම්පාදක කාර්යය මණ්ඩල | 466,573.75 | 927,606.70 |
| **402-1-4-H** | ගමන් වියදම් දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ් | 86,773.50 | 123,837.10 |
| | | **11,610,943.93** | **19,999,283.44** |

| 18.5 | වෙනත් විශේෂ දීමනා | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| 402-1-5-A | වෙනත් විශේෂ දීමනාව - ධාවන කාර්යය මණ්ඩල | 393,238,950.52 | 437,899,464.85 |
| 402-1-5-B | වෙනත් විශේෂ දීමනාව - ගිණුම් කාර්යය මණ්ඩල | 107,426,553.22 | 116,043,321.27 |
| 402-1-5-C | වෙනත් විශේෂ දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 102,894,857.75 | 123,423,394.02 |
| 402-1-5-D | වෙනත් විශේෂ දීමනාව - ගිණුම් පරීක්ෂක කාර්යය මණ්ඩල | 15,033,657.06 | 15,379,951.96 |
| 402-1-5-E | වෙනත් විශේෂ දීමනාව - විනය කාර්යය මණ්ඩල | 17,259,380.24 | 19,605,012.90 |
| 402-1-5-F | වෙනත් විශේෂ දීමනාව - ආරක්ෂක කාර්යය මණ්ඩල | 66,946,526.99 | 83,976,069.26 |
| 402-1-5-G | වෙනත් විශේෂ දීමනාව - සම්පාදක කාර්යය මණ්ඩල | 39,866,996.44 | 45,473,289.33 |
| 402-1-5-H | වෙනත් විශේෂ දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ | 2,555,109.32 | 2,628,203.81 |
| | | **745,222,031.54** | **844,428,707.40** |

| 18.6 | අළුත්වැඩියා හා නඩත්තු | | |
|---|---|---|---|
| 402-2-1 | අළුත්වැඩියා හා නඩත්තු (ගරාජ් ගොඩනැගිලි) | 36,200,859.64 | 53,278,164.37 |
| 402-2-2 | ලී බඩු හා කාර්යාල උපකරණ නඩත්තු | 10,282,886.32 | 9,961,702.27 |
| 402-2-3 | නිලවාහන නඩත්තු | 97,651,530.53 | 103,674,696.38 |
| 402-2-4 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු | 27,924,512.17 | 38,353,851.05 |
| | | **172,059,788.66** | **205,268,414.07** |

| 18.7 | ක්ෂය | | |
|---|---|---|---|
| 402-3-2 | ක්ෂය - වෙනත් වාහන | 11,630,339.50 | 12,825,422.83 |
| 402-3-3 | ක්ෂය - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 38,550,745.47 | 9,683,446.89 |
| 402-3-4 | ක්ෂය - ලී බඩු හා කාර්යාල උපකරණ | 8,140,277.42 | 8,189,301.98 |
| 402-3-5 | ක්ෂය - ගොඩනැගිලි | 1,569,663.85 | 1,291,730.30 |
| 402-3-6 | ක්ෂය - පරිගණක | 26,133,711.61 | 23,473,070.96 |
| 402-3-7 | ක්ෂය - වෙනත් | 6,258,085.71 | 6,198,911.24 |
| 402-3-9 | ක්ෂය - වායු සමීකරණ | 1,144,194.71 | 942,346.45 |
| 402-3-10 | ක්ෂය - බස්රථ එන්ජින් | 226,338,436.05 | 226,338,436.05 |
| 402-3-12 | ක්ෂය - ටිකට් මැෂින් | 39,098,386.57 | 41,339,254.95 |
| 402-3-13 | ක්ෂය - පරිගණක මෘදුකාංග | 5,232,527.41 | 5,854,749.20 |
| | එකතුව | **364,096,368.30** | **336,136,670.85** |

**19.** **මූල්‍ය හා වෙනත් වියදම්**

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| **402-4-1** | අයිරා පොලිය | 1,010,005.95 | 963,717.03 |
| **402-4-2** | බැංකු ගාස්තු | 5,813,691.27 | 6,481,077.56 |
| **402-4-3** | හර බදු | - | 7,589,371.66 |
| **402-4-4** | කල්බදු පොලී ගිණුම | 213,760,343.00 | 102,122,534.24 |
| **402-4-5** | වෙනත් මූල්‍ය වියදම් | 43,671,235.74 | 267,276,187.52 |
| | එකතුව | **264,255,275.96** | **384,432,888.01** |

| ගිණුම් සංකේත | විස්තරය | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| 303-7 | තැන්පතු පොලී ආදායම | 184,884,183.17 | 254,290,570.50 |
| | **මුළු මූල්‍ය වියදම** | **184,884,183.17** | **254,290,570.50** |

| | | | |
|---|---|---|---|
| | **ශුද්ධ මූල්‍ය වියදම** | **79,371,092.79** | **130,142,317.51** |

**20.** **නිෂ්පාදන අලාභය**

| | | | 31.12.2020 | | 31.12.2019 |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| **403-1** | 01.01.2020 දිනට නොනිමි වැඩ - අමුද්‍රව්‍ය | 1,509,513.37 | | 9,697,053.38 | |
| | **එකතු කලා** | | | | |
| **403-2** | අමුද්‍රව්‍ය මිලදී ගැණුම් | 159,820,527.87 | | 137,255,432.81 | |
| | | | 161,330,041.24 | | 146,952,486.19 |
| | **අඩු කලා** | | | | |
| **403-4** | භාණ්ඩ ආපසු යැවුම් | 627,301.56 | | 340,051.39 | |
| | 31.12.2020 දිනට නොනිමි වැඩ | 11,392,281.74 | | 1,509,513.37 | |
| | | | 12,019,583.30 | | 1,849,564.76 |
| | නිමි භාණ්ඩවල ප්‍රාථමික පිරිවැය | | 149,310,457.94 | | 145,102,921.43 |
| | **කම්හල් පොදු කාර්යය පිරිවැය** | | | | |
| **403-1-A** | කම්හල් වැටුප් හා දීමනා | 125,638,580.76 | | 129,920,190.73 | |
| **403-1-B** | අතිකාල | 21,898,747.06 | | 12,477,444.04 | |
| **403-1-C** | ගමන් වියදම් දීමනා | 73,607.50 | | 191,047.50 | |
| **403-1-D** | සේවක අර්ථසාධක අරමුදල | 12,775,587.35 | | 11,459,201.68 | |
| **403-1-E** | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 2,226,177.86 | | 2,747,849.66 | |
| **403-1-F** | වෙනත් වියදම් | 4,200.00 | | 289,360.76 | |
| | කම්හල් පිරිවැය | | 162,616,900.53 | | 157,085,094.37 |
| | **මුළු නිෂ්පාදන පිරිවැය** | | 311,927,358.47 | | 302,188,015.80 |
| **403-3** | නිෂ්පාදන ආදායම | 236,690,485.97 | 236,690,485.97 | | 282,015,595.59 |
| | **නිෂ්පාදන හිභය** | | **75,236,872.50** | | **20,172,420.21** |

**21.** **රජයේ ප්‍රතිපාදන**

| **ගිණුම් සංකේත** | **විස්තරය** | **31.12.2020**<br>රු. | **31.12.2019**<br>රු. |
|---|---|---|---|
| **302-2-B** | පුනරුත්ථාපන ප්‍රතිපාදන | 1,091,904,937.00 | 1,473,921,845.00 |
| **302-5-E** | රජයේ ප්‍රතිපාදන - බස්රථ | - | - |
| **302-6-F** | වර්ෂය සඳහා රජයේ ප්‍රතිපාදන | 35,462,800.76 | - |
| | **එකතුව** | **1,127,367,737.76** | **1,473,921,845.00** |

| | | රත්මලාන සහ ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල් | | |
|---|---|---|---|---|
| | විකුණුම් | | | 195,929,847.81 |
| | ආරම්භක ශේෂය - ඩීසල් | 1,057,472.00 | | |
| | ආරම්භක ශේෂය - පෙට්‍රල් | 898,720.00 | | |
| | ආරම්භක ශේෂය - ලිහිසි | 311,435.00 | | |
| | | | 2,267,627.00 | |
| | එකතු කළා | | | |
| | මිලදී ගැණුම් - ඩීසල් | 128,042,016.63 | | |
| | මිලදී ගැණුම් - පෙට්‍රල් | 65,029,985.05 | | |
| | මිලදී ගැණුම් - ලිහිසි | 558,981.10 | | |
| | | | 193,630,982.78 | |
| | | | 195,898,609.78 | |
| | අවසන් ශේෂය - ඩීසල් | 1,655,944.16 | | |
| | අවසන් ශේෂය - පෙට්‍රල් | 220,267.23 | | |
| | අවසන් ශේෂය - ලිහිසි | 303,860.00 | | |
| | | | (2,180,071.39) | |
| | | | | 193,718,538.39 |
| | **ශුද්ධ ලාභය** | | | 2,211,309.42 |
| | වෙනත් ආදායම් | (139,906.58) | | |
| 303-7 | පොළී ආදායම | 54,191.78 | | |
| 303-15 | යෝග්‍යතා සහතික | | (85,714.80) | |
| | | | | (85,714.80) |
| | | | | 2,125,594.62 |
| | පරිපාලන වියදම් | | | |
| **402-1-1-C** | වැටුප් හා වේතන - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 1,871,835.48 | | |
| **402-1-2-C** | අතිකාල හා නිවාඩු දීමනා - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 846,797.81 | | |
| **402-1-3-C** | ජීවනාංක දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 748,800.00 | | |
| 402-1-5-C | වෙනත් විශේෂ දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල | 1,108,567.85 | | |
| | | | 4,576,001.14 | |
| 402-2-1 | අළුත්වැඩියා හා නඩත්තු (ගරාජ් ගොඩනැඟිලි) | 5,810.00 | | |
| 402-2-2 | ලී බඩු හා කාර්යාල උපකරණ නඩත්තු | 60,205.00 | | |
| 402-2-4 | අළුත්වැඩියා හා නඩත්තු-යන්ත්‍ර | 307,580.00 | | |
| **402-2-5** | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 12,125.00 | | |
| **402-2-7** | දුරකතන | 77,888.36 | | |
| **402-2-8** | විදුලිය | 246,240.25 | | |
| **402-2-14** | සුභසාධන වියදම් | 11,665.00 | | |
| **402-2-21** | වෙනත් වියදම් | 11,500.00 | | |
| | | | 733,013.61 | |
| | මූල්‍ය වියදම් | | | |
| **402-4-2** | බැංකු ගාස්තු | 15,290.00 | 15,290.00 | |
| | මුළු පිරිවැය | | 5,324,304.75 | (5,324,304.75) |
| | **ශුද්ධ ලාභය** | | | (3,198,710.13) |

මගේ අංකය / எனது இல. / My No. } සීඕටී/ඒ/එස්එල්ටීබී/01/එෆ්ඒ/2020/134   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2022 මාර්තු 06 දින

සභාපති

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය වියාචනය**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

### (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(i) මණ්ඩලය සතු ස්ථාවර තැන්පතු වටිනාකම රු.628,678,099 ක් වූ අතර , ස්ථාවර අයිරා පහසුකමක් ද මහජන බැංකුව වෙතින් සලසා ගෙන තිබුණි. මේ සඳහා රු.325,100,000 ක ස්ථාවර තැන්පතු , ඇප සුරකුමක් ලෙස ඉදිරිපත් කර තිබුණු අතර, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත අංක 07 හි (SLFRS7) 14 ඒ හා බී වගන්ති ප්‍රකාරව අනාවරණය කිරීම් කර නොතිබුණි.

(ii) ප්‍රමිත අංක 16 හි 58 ඡේදය ප්‍රකාරව රු.378,104,967 ක ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම වෙන වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(iii) හොරණ පොකුණුවිට පිහිටි මණ්ඩලයට අයත් ඉඩමකින් කොටසක් මහා මාර්ග ඉදි කිරීමේ කටයුතු සඳහා 2016 වර්ෂයේදී රජයට පවරාගෙන තිබුණ අතර , ඒ සඳහා වන්දි වශයෙන් ලද රු.30,371,875 ක මුදල එම වර්ෂය තුළ නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පරමාර්ථයෙන් සංචිත ගිණුමට බැර නොකර අනෙකුත් ආදායම් ගිණුම බැර කර තිබුණි. තවද ඉඩමෙහි පිරිවැය ඉඩම් හා ගොඩනැගිලි ගිණුම බැර කිරීමට කටයුතු කර නොතිබුණු අතර , ඉඩම සඳහා ලද වන්දි මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(iv) 2018 වර්ෂයේ සිට මණ්ඩලය සතුව කෙටි කාලීන ආයෝජන (REPO) රු.350,000,000 ක් තිබුණු අතර , ඒ සඳහා ලැබිය යුතු රු.2,549,442 ක පොලි ආදායම සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන නොතිබුණු අතර එමනිසා මණ්ඩලයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(v) ජපන් ජාත්‍යන්තර සහයෝගිතා වැඩ පිළිවෙල යටතේ 2019/2020 වසර තුළදී රු.426,390,078 ක් වටිනා යන්ත්‍රෝපකරණ මණ්ඩලයට ලැබී තිබුණි. මෙම යන්ත්‍රෝපකරණ අතුරින් රු.189,343,036 ක් වටිනා අයිතම 90 ක් 2019 වර්ෂයේදී ලැබී තිබුණු ඒවා වූ අතර , එම යන්ත්‍ර 2019 වර්ෂයේ යන්ත්‍රෝපකරණ ගිණුමට හර කර ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම බැර කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම වත්කම් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා රේගු ගාස්තු වශයෙන් රු 38,663,394ක මුදලක් 2019 වර්ෂයේදී ගෙවා තිබුණි .මෙම වටිනාකම ප්‍රාග්ධනිත කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16ට පටහැනිව රු.322,194 ක් ක්ෂය කර තිබුණි. ඒ අනුව ක්ෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(vi) ප්‍රමිත අංක 20 හි 29 ඡේදය ප්‍රකාරව ,රජයේ ප්‍රදාන විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වෙනම දැක්විය යුතු වුවත් රු.5,677,857,594 ක වාර ප්‍රවේශ පත්‍ර, සිසු සැරිය හා නිසිසැරිය සහනාධාර විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මෙහෙයුම් ආදායම් යටතේ දක්වා තිබුණි.

(vii) ප්‍රමිත අංක 17 හි 20 ඡේදය ප්‍රකාරව ,මූල්‍ය කල්බදු වල සාධාරණ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් ලෙස හඳුනාගත යුතු වුවත් කල්බදු ක්‍රමය යටතේ 2019/2020 වසර තුළදී මිලදී ගෙන තිබුණු රු.1,046,559,865 ක් වටිනා ආසන 50 සාමාන්‍ය බස් රථ 272 ක් හා ආසන 33 බස් රථ 53 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් යටතේ දක්වා නොතිබුණි. තවද බස් රථ 325 ක් මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.263,435,339 ක අත්තිකාරම් මුදලක් කල්බදු ණයහිමි ගිණුම හර නොකිරීම නිසා කල්බදු ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(viii) ප්‍රමිත අංක 07 ප්‍රකාරව පොලී ආදායම ලෙස ලද රු.187,186,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.184,884,817 ක මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් රු.2,301,826 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ix) සමාලෝචිත වර්ෂයේ සිදු කළ රු.1,020,000,000 ක ආයෝජනය ප්‍රමිත අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස සටහන් කර නොතිබුණි.

(x) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් වල රු.59,060,290 ක වැඩිවීම ගිණුම් ප්‍රමිත 7 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(xi) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ණය හිමියන්ට ගෙවීම් ගිණුමේ වෙනස රු.326,008,840 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් ලෙස රු.343,407,781 ක් ලෙස දැක්වීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.17,398,940 ක් මුදල් ගලායාම් වැඩියෙන් දක්වා තිබුණි.

(xii) ප්‍රමිත අංක 16 හි 34 ඡේදය අනුව ඉඩම් විකුණන අවස්ථාවේදී වටිනාකම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද , මණ්ඩලයට අයත් වේරහැර ඉඩම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට විකිණීමේදී 2018 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය දක්වා මේ සඳහා රු.4,554,000 ක් ලැබී තිබුණු අතර, එම මුදල ණය හිමි ගිණුම බැර කර තිබුණි. ඒ අනුව ණය හිමි ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද ඉඩමේ විකුණුම් වටිනාකම වූ රු.5,000,000,000 ක් සම්බන්ධයෙන් වත්කම් ගිණුම බැර කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර ඇති ක්‍රීඩාංගණය බාහිර පුද්ගලයන් හා ආයතන වෙත ක්‍රීඩා කටයුතු සඳහා ලබා දීමෙන් ලද රු.4,470,901 ක මුදලක් මණ්ඩලයේ ආදායමට බැර නොකර ක්‍රීඩා සමාජ ගිණුමට බැර කිරීම නිසා මණ්ඩලයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කල්බදු ක්‍රමයට ලබා ගෙන තිබූ බස් රථ 325 ක් සඳහා ගෙවූ රු.263,435,339 ක මූලික ගෙවීම ( Down Payment ) ඉදිරි ගෙවීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.1,290,782,781 ක අක්‍රීය ගිණුම් හර ශේෂ හා රු.18,526,264,783 ක අක්‍රීය ගිණුම් බැර ශේෂ සඳහා අදාළ විගණන සාක්ෂි කිසිවක් විගණනයට නොලැබුණි. තවද රු.23,386,714,900 ක ගිණුම් අයිතම 09 කට අදාළව උපලේඛන හා මූලාශ්‍ර උපලේඛන විගණනයට ලබා දී නොතිබුණි.

(ඉ) මණ්ඩලයට අයත් වේරහැර පිහිටි ඉඩමක් කොතලාවල ආරක්ෂක පීඨයට පැවරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් 2018 වර්ෂයේදී ලද රු. 2,000,000,000 හා සමාලෝචිත වර්ෂයේදී ලද රු.2,054,000,000 මුළු එකතුව වූ රු.4,054,000,000 ක මුදල නිවැරදි ලෙස ගිණුම්ගත නොකොට අනෙකුත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලද මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඊ) පරිගණක හා තොරතුරු තාක්ෂණ උපකරණ, ස්ථාවර වත්කම් යටතේ දැක්විය යුතු වුවත් , රු.42,878,983 ක පරිසනක හා උපකරණ ලිපි ද්‍රව්‍ය යටතේ ඇතුළත් කිරීම නිසා මූල්‍ය තතත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ටිකට් මැෂින් වලට අදාළ බින් කාඩ් පත්‍ර අනුව වටිනාකම රු.378,354,463 ක් වන ටිකට් යන්ත්‍ර මූල්‍ය ප්‍රකාශන තුළ රු.266,471,937 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.111,937,066 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඌ) ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වෙන වෙනම හඳුනාගෙන නොතිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,569,663 ක ක්ෂය වටිනාකමක් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි.

(එ) වටිනාකම රු.1,935,404 ක් වන වායුසමීකරණ යන්ත්‍ර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) පරිගණක මෘදුකාංග ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය ගිණුම්කරණ ප්‍රතිපත්තිය හඳුනාගෙන නොතිබුණු අතර රු.31,394,194 ක පරිගණක මෘදුකාංග දේපල පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඔ) ශේෂ පිරික්සුම අනුව දෛනික මාර්ගස්ත ආදායම රු.57,150,354 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම අගය රු.53,727,377 ක් ලෙස දැක්වීම නිසා අතැති මුදල් ශේෂය රු.3,422,977 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ශේෂ පිරික්සුම අනුව වෙළඳ ණය හිමි ශේෂය රු.2,686,472,044 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.2,655,641,299 ක් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනයේ ණය හිමි ශේෂය රු.30,830,745 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) ලැබූ ආදායම් ගිණුමේ පොලි අදායම රු.184,884,183 ක් ලෙස දැක්වුවද , ශේෂ පත්‍රයට අනුව රු.189,634,228ක් විය. ඒ අනුව පොලි ආදායම විස්තිරණ ආදායම් ප්‍රකාශයේ රු.4,750,045 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) ගිණුම් සටහන් අනුව වෙනත් ආදායම් රු.11,986,655ක් ලෙස දක්වා තිබුණද, ශේෂ පිරික්සුම අනුව සත්‍ය වෙනත් ආදායම්වල වටිනාකම රු.14,471,809 ක් විය. ඒ අනුව රු.2,485,154 කින් වෙනත් ආදායම් සමාලෝචිත වර්ෂයේ අඩුවෙන් දක්වා තිබුණි.

(ච) රියදුරු පුහුණු පාසල් වලින් ලද ආදායම රු.13,894,207ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, ශේෂ පිරික්සුම අනුව එම ආදායම රු.14,471,809 ක් විය. ඒ අනුව රියදුරු පුහුණු පාසල් ආදායම රු.20,449,386 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) හමුදා ගමන් බලපත්‍ර ආදායම ගිණුම් සටහන් 15 අනුව රු.142,858,305 ක් වුවද මූල්‍ය ප්‍රකාශ අනුව එය රු.147,095,230ක් විය. ඒ අනුව රු.4,236,925 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම නිසා ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ට) රු.1,140,750 ක මාර්ගගත බස් රථ වෙන් කරවා ගැනීමේ ගාස්තු ආදායම , ගෙවිය යුතු වියදමක් ලෙස මාර්ගගත වෙන් කිරීම් පාලන ගිණුමේ ඇතුළත් කර තිබීම හේතුවෙන් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඩ) රු.2,180,071 ක ඉන්ධන තොග වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොග වටිනාකමට ඇතුළත් කර නොතිබිමෙන් තොග ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ණ) වාර්ෂික ප්‍රසාද දීමනාව වශයෙන් ගෙවූ මුදල මූල්‍ය ප්‍රකාශන අනුව රු.291,894,499 ක් හා ශේෂ පිරික්සුමට අනුව රු.291,347,479 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.547,020 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ත) සමාලෝචිත වර්ෂයේ ඛනිජ තෙල් සංස්ථා ණය හිමි ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව හා ශේෂ පිරික්සුම අනුව පිළිවෙලින් රු.41,491,285 ක් හා රු.63,997,291 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල එම ශේෂය රු.22,506,006 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ද) වටිනාකම රු.2,864,130,067 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුම් සහ වටිනාකම රු.11,524,081,084 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛන හා වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(න) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු.1,367,754,792 ක් වටිනා ගර්භිත බස් රථ වර්ෂ 05 ක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල , පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති අතර ඒ සම්බන්ධයෙන් මණ්ඩලය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ප) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.6,459,777 ක ඉන්ධන තොග අතිරික්තයක් පවතින අතර එය ලාභ අලාභ ගිණුමේ ආදායම් ලෙස දක්වා තිබු අතර , ඒ පිළිබඳ මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමණාකරණයේ වගකීමක් වන අතර , කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමණාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම , පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා මණ්ඩලයේ තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ අ (i) (ii) (iii) (iv) (v) , (ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකුල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1980 අංක 47 දරන පාරිසරික පනත හා 2008 ජනවාරි 28 දිනැති 1533/16 අති විශේෂ ගැසට් පත්‍රය | වාහන සේවා කිරීම සම්බන්ධයෙන් සියළු ඩිපෝවන් විසින් බලපත්‍රයක් ලබා ගත යුතු වුවද මණ්ඩලයේ කිසිදු ඩිපෝවක් විසින් එම බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඩිපෝ පරිශ්‍රයේ පිරිසිදු කිරීම් පිළිබඳ මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි |

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) | 5.1.2 වගන්තිය | අරමුණු හා ඉලක්ක පදනම් කර ගෙන ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතු වුවද , මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 5.2 වගන්තිය | ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමේදී අය වැය ගත ආදායම් හා වියදම් ප්‍රකාශනය , අය වැය ගත ශේෂ පත්‍රය , අයවැය ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අයවැය ගත ප්‍රාග්ධන වියදම් ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) | 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 306ක් ප්‍රමාද වී 2021 ඔක්තෝම්බර් 26 දිනදීය. |
| (iv) | 9.2 වගන්තිය | ආයතනයේ සංවිධාන සටහන ඊට අදාළ බඳවා ගැනීමේ හා උසස් වීම් පරිපාටි සකස් කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන නොතිබුණි. |

(ඇ)2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 රාජ්‍ය මුදල් චක්‍රලේඛය — චක්‍රලේඛය පරිදි තිරසර සංවර්ධන ඉලක්කයන් හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වුවද, මණ්ඩලය අදාළ චක්‍ර ලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) වසර 02 කට වැඩි කාලයක් සිට පැවත එන රු.6,141,909 ක කොන්දොස්තර හිඟ ශේෂය අය කර ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) මණ්ඩලයේ නිෂ්පාදන ගිණුම වසර 03 කට වැඩි කාලයක සිට අලාභ සහිත තත්වයක් පෙන්නුම් කරන අතර සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන ඌනතාවය රු.75,236,872 ක් විය. නිෂ්පාදන කර්මාන්ත ශාලා උපරිම ධාරිතාවයෙන් යොදා ගෙන පිරිවැය අවම කිරීම තුළින් ලාභ සහිතව පවත්වා ගැනීම සඳහා මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන පිරවුම්හල් ආදායම රු.2,125,594 ක් වුවද වැටුප් සහ වෙනත් දීමනා සඳහා රු.4,576,001 ක වටිනාකමක් ගෙවීම හේතුවෙන් දළ මෙහෙයුම් අලාභයක් සිදු වී තිබුණි.

(ඈ) ඉන්ධන පිරවුම්හල් වලින් අඛණ්ඩව වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පාඩු ලබන අතර , මණ්ඩලය විසින් ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති